# රණවිරුවා

2021 ඔක්තෝබර් • 234 කලාපය



## ඓතිහාසික 72 වන යුද්ධ හමුදා සංවත්සරය

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.

# ගජබා රෙජිමේන්තුවට නවීන පහසුකම්වලින් සමන්විත ගොඩනැගිලි සංකීර්ණයක්...





යුද්ධ හමුදා දින සංවත්සරයට සමගාමීව අභිනවයෙන් ඉදිකරනු ලැබූ තෙමහල් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය අතිගරු ජනාධිපතිතුමන්ගේ සුරතින් විවෘත කරමින්.

# "ගෝඨාභය රාජපක්ෂ ක්‍රිකට් ක්‍රීඩාංගණය" විවෘත කරමින්...







අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් ගජබා රෙජිමේන්තු මූලස්ථානයේ පැවති යුද්ධ හමුදා සංවත්සර දින සැමරුම් උත්සවයේ සමාප්තිය සනිටුහන් කරමින් එම රෙජිමේන්තුවේ හටපිරිස් විසින් ඉදිකළ "ගෝඨාභය රාජපක්ෂ ක්‍රිකට් ක්‍රීඩාංගණය" විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වෙමින්.

# 72 වන යුද්ධ හමුදා සැමරුම වෙනුවෙන් යුද්ධ හමුදාධිපති ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක්...



යුද්ධ හමුදාවට ආශිර්වාද එක් කිරීමේ සහ ධජයන්ට සෙත් පැතීමේ සමාරම්භක ආගමික කටයුතු පැවැත්වෙමින්.



අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභිමුවදී යුද්ධ හමුදා ධජයන්ට ආශිර්වාද එක් කරමින්.



ඓතිහාසික කතරගම කිරිවෙහෙර අභියසදී හා කතරගම දේවාල පරිශ්‍රයේදී යුද්ධ හමුදා ධජයන්ට සෙත් පැතීමේ ආශිර්වාද පූජාව.



බොරැල්ල, සියලු සාන්තුවරුන්ගේ දේවස්ථානයේදී පැවැති ආශිර්වාද පූජාව.



කොළඹ 06 මයුරපති ශ්‍රී භද්‍රකාලි අම්මාන් කෝවිලේ දී පැවති "අභිෂේකම්" විශේෂ හින්දු ආශිර්වාද පූජාව.



කොළඹ 03, කොල්ලුපිටිය ජුම්මා ඉස්ලාමීය පල්ලියේදී පැවැති ඉස්ලාමීය ආගමික වතාවත්.



බත්තරමුල්ල රණවිරු ස්මාරකය අභියසදී පැවැත්වූ මාතෘ භූමිය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන් සිහිපත් කිරීමේ රණවිරු අනුස්මරණ උත්සවය.



යුද්ධ හමුදා මූලස්ථානයේදී සංවිධානය කරනු ලැබූ සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය.







# ඓතිහාසික සාලියපුරදී සැමරූ ගජබා රෙජිමේන්තු අභිමානය...

ඉකුත් ඔක්තෝබර් 14 වන දිනට යෙදුණු ගජබා රෙජිමේන්තුවේ සංවත්සර දිනය නිමිත්තෙන් අනුරාධපුර සාලියපුර පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී විචිත්‍රවූත් ගාම්භීරවූත් සැමරුම් උත්සවයක් පැවැත්විණ. එම අවස්ථාවට සපැමිණි ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මෙන්ම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් මහත් හරසරින් පිළිගනු ලැබීය. එහිදී ගජබා රෙජිමේන්තුවේ සියලුම බලඇණි නියෝජනය කරමින් නිලධාරින් 42 ක් සහ සෙසු නිලයින් 520 දෙනෙකුගෙන් සමන්විත අභිමානවත් ආචාර පෙළපාළියේ ගෞරවාචාරය එතුමන් වෙත පිරිනැමීය.

ඉන් අනතුරුව, ගජබා රෙජිමේන්තුවේ නිර්මාතෘ මේජර් ජෙනරාල් විජය විමලරත්න ගජබා රෙජිමේන්තුවේ ආරම්භය හා ප්‍රවර්ධනය වෙනුවෙන් දැක්වූ දායකත්වය වෙනුවෙන් සිය කෘතඥතාවය පුදකොට එතුමන්ගේ පිළිරුව අභියස පුෂ්පෝපහාර පුද කිරීමටද යුද්ධ හමුදාධිපති එක්විය.

සංවත්සර දිනයේ හටපිරිස් ඇමතූ යුද්ධ හමුදාධිපතිතුමන් ගජබා රෙජිමේන්තුවට 2 වන ලුතිනන්වරයෙකු වශයෙන් අනුයුක්ත කරන විට එම රෙජිමේන්තුවේ නිර්මාතෘ වන මේජර් ජෙනරාල් විජය විමලරත්න එවකට සිය 1 වන අණදෙන නිලධාරී වශයෙන්, නායකයෙකු ලෙස ඉදිරියට යාමට තමාට ලබාදුන් උපදෙස් හා මාර්ගෝපදේශ වෙනුවෙන් සිය කෘතඥතාවය එතුමන් වෙත පුද



කලේය. එසේම, රෙජිමේන්තුවේ දියුණුව හා ජයග්‍රහණ වෙනුවෙන් කැපවීමට මඟපෙන්වූ ඛණ්ඩහාර සැරයන් ජයසුන්දර ඇතුළු ගජබා රෙජිමේන්තුවේ සියලුම නිලධාරින් සහ සෙසු නිලයින් වෙත ද යුද්ධ හමුදාධිපතිතුමන් සිය ගෞරවය පුදකරන්නට අමතක නොකලේය.



වසර 38 ක් සපුරන ගජබා රෙජිමේන්තුවේ මෙවර සංවත්සර උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ඉන්දීය යුද්ධ හමුදා ප්‍රධානී ජෙනරාල් මනෝජ් මුකුන්ද් නාරාවන සහභාගී වූ අතර, එය ගජබා රෙජිමේන්තුවට මහත් ගෞරවයක් ගෙන දුන් සුවිශේෂී සන්ධිස්ථානයක් බවට පත්විය. තවද, වත්මන් යුද්ධ හමුදාධිපති ගජබා රෙජිමේන්තුවෙන් බිහිවූ 1 වන හමුදාධිපති ලෙසත්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලෙසත් එම රෙජිමේන්තුවෙන් බිහිවූ ප්‍රථම ජෙනරාල්වරයා ලෙසත් තනතුරු දැරීම ගජබා රෙජිමේන්තුවේ අසමසම අභිමානය තවදුරටත් තීව්‍ර කරවන්නකි.

සංවත්සරය සනිටුහන් කරමින් රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේවයේ නියුතු නිලධාරින් වෙනුවෙන් අභිනවයෙන් ඉදිකළ නේවාසික පහසුකම් සංකීර්ණය රෙජිමේන්තු අධිපති ගේ සුරතින් විවෘත කිරීමද එහිදී සිදුවිය.





# යුද්ධ හමුදාධිපතිතුමාගේ රුසියානු සංචාරයේ විශේෂ මතක සටහන්...





# ලක් අභිමනට රුසියාවෙන් බුහුමන්...

රුසියානු එක්සත් සමුහාණ්ඩුවේ භූමි මෙහෙයුම් හමුදා ප්‍රධානී හා සේනාධිනායක ජෙනරාල් ඔලෙග් සැලියුකෝව් (*General Oleg Salyukov*) ගේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ආරාධනයෙන් ශ්‍රී ලංකා ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් පසුගියදා රුසියාවේ සංචාරයක නිරත විය. එහිදී රුසියානු හමුදා සම්ප්‍රදායානුකූලව මෙරට යුද්ධ හමුදාධිපති මහත් හරසරින් පිළිගනු ලැබීය.



රුසියානු හමුදාව විසින් මෑත කාලීනව පිරිනැමූ ඉහළම සම්මාන ආචාර පෙළපාලියක ගෞරවාචාරය ශ්‍රී ලංකා ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා වෙත එහිදී පිරිනමනු ලැබුවේ ඛණ්ඩ හතරකින් සහ හමුදා තූර්යවාදක කණ්ඩායමකින් සැදුම් ලත් සම්මාන ආචාර පෙළපාලියකින් වන අතර, එය රුසියානු හමුදාව ශ්‍රී ලංකා හමුදාව වෙත දක්වන ඉහළම පිළිගැනීම සහ ගෞරවය මනාව පිළිබිඹු වූ අවස්ථාවකි.

එම ගෞරවාචාර වලින් අනතුරුව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති මොස්කව් ක්‍රෙම්ලිනයේ ඇලෙක්සැන්ඩ්‍රොව්ස්කි උද්‍යානයේ (*Alexandrovsky Garden of Moscow Kremlin*) පිහිටි *'Tomb of the Unknown Soldier'* රුසියානු රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර පුද කිරීමට ද එක්විය.

තවද, නිරන්තරයෙන් ජනාකීර්ණ හා කාර්යබහුල මොස්කව් නුවර ශාන්ත පරිසරයක පිහිටි අවි ආයුධ කෞතුකාගාරය නැරඹීමට ද හෙතෙම ආරාධනා ලැබීය.

ශ්‍රී ලංකා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති සිය සංචාරය අතරතුර මොස්කව් නුවර පිහිටි උසස් ඒකාබද්ධ යුද අණදෙන පාසල (*Higher Combined Arms Command School*) හි සේනාවිධායක මේජර් ජෙනරාල් රෝමන් බින්යුකොව් (*Major General Roman Binyukov*), නාරෝ-ෆොමින්ස්ක් (*Naro-Fominsk*) ප්‍රදේශයේ පිහිටි 4 වන ආරක්ෂක සන්නද්ධ රථ සේනාංකයේ (*Guards Tank Division*) සේනාංකාධිපති සහ මිහයිලොව්ස්කායා (*Mikhailovskaya*) පිහිටි හමුදා කාලතුවක්කු විද්‍යාපීඨය (*Military Artillery Academy*) හි සංචාරයක ද නිරත විය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිගේ මෙම සංචාරය රුසියානු භූමි මෙහෙයුම් හමුදා ප්‍රධානී 2020 වර්ෂයේ පෙබරවාරි මස ශ්‍රී ලංකාවේ සිදුකළ සංචාරය අතරතුර රුසියාවේ සංචාරයක් සඳහා පැමිණෙන ලෙස කළ විවෘත ආරාධනාවක ප්‍රතිඵලයකි.

# යුද්ධ හමුදාධිපති මොස්කව් නුවර පිහිටි උසස් ඒකාබද්ධ යුද අණදෙන පාසලේ සංචාරයක...







රුසියාවේ සංචාරයක නිරත ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති මොස්කව් නුවර පිහිටි උසස් ඒකාබද්ධ යුද අණදෙන පාසල ද නිරීක්ෂණය කළේය. එම පාසල රුසියානු සන්නද්ධ හමුදාවේ උසස්ම හමුදා අධ්‍යාපන ආයතනය වන අතර, එය වර්ෂ 1917 දෙසැම්බර් මාසයේදී 1 වන මොස්කව් විප්ලවීය යාන්ත්‍රික අවි නිලධාරීන්ගේ පාසල (*1st Moscow revolutionary machine gun officers: school*) ලෙස පිහිටුවන ලදී. එය පසුව මොස්කව් නුවර පිහිටි උසස් ඒකාබද්ධ යුද අණදෙන පාසල බවට පත් වූ අතර, අණදෙන නිලධාරීන් පුහුණු කිරීම සඳහා එම පුහුණු පාසල පවත්වාගෙන යනු ලබයි. උසස් වෘත්තීය අධ්‍යාපනයක් ඇති නිලධාරීන්, හමුදා ඉංජිනේරුවන් සහ රටේ ආරක්ෂක ක්‍රියාමාර්ගයන් ශක්තිමත් කිරීමේ ගැටලු විසඳීමද හමුදා නිලධාරීන්ගේ වෘත්තීය අධ්‍යාපනය වැඩිදියුණු කිරීමද අරමුණු කරගත් මූලික හා ව්‍යවහාරික විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීම මෙම පාසල මඟින් සිදුකරනු ලබයි.

# ඓතිහාසික සබඳතා සිහිපත් කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති සහ රුසියානු හමුදා ප්‍රධානී අතර හමුවක්...





සංචාරයේ නිරත ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති රුසියානු භූමි මෙහෙයුම් හමුදා ප්‍රධානී සමඟ සුහද සාකච්ඡාවකට ද එක්විය. එහිදී, දෙරට අතර පවතින හමුදා සබඳතා තවදුරටත් පුළුල් තලයකට ගෙන ඒමත් යාන්ත්‍රික හා තාක්ෂණික අංශ වලට අදාළ තවත් වැදගත් කරුණු රැසක් පිළිබඳවත් සාකච්ඡාවට ලක්කෙරිණි.

හමුදා ප්‍රධානීන් අතර පැවති සාකච්ඡාව අතරතුර ශතවර්ෂ ගණනාවක් පුරා පැවත එන දෙරටේ ඓතිහාසික මතකයන්ද සිහිපත් කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති රුසියානු රජය 2009 මැයි මාසයට පෙර පැවති බෙදුම්වාදී තර්ජන කාලය තුළදී ශ්‍රී ලංකාවට ලබාදුන් තාක්ෂණික හා යාන්ත්‍රික සහයෝගීතාවය වෙනුවෙන්ද විශේෂයෙන් සිය කෘතඥතාවය පුද කළේය.

# රුසියානු හමුදා කාලතුවක්කු විද්‍යාපීඨයේ සංචාරය කරමින්...

ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති පසුගිය ඔක්තෝබර් 28 වන දින පෙරවරුවේ විද්‍යාඥයින් සහ විශේෂඥයින් සිය වෘත්තීමය නිපුණත්වය භාවිතා කරමින් කනිෂ්ඨ නිලධාරින්ට කාලතුවක්කු සහ අනෙකුත් සුළු අවි පිළිබඳ දැනුම ලබාදෙනු ලබන, වර්ෂ 1855 දී ශාන්ත පීටර්ස්බර්ග් (*Saint Petersburg*) ප්‍රදේශයේ ස්ථාපිත කළ කීර්තිමත් මිහායිලොව්ස්කායා හමුදා කාලතුවක්කු විද්‍යාපීඨයේද (*Mikhailovskaya Military Artillery Academy*) සංචාරයක නිරත විය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාලතුවක්කු පිළිබඳ තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීමෙහිලා වැදගත්වන කරුණු පිළිබඳ හෙතෙම එහිදී සොයාබැලීය.





# ශාන්ත පීටර්ස්බර්ග් ඓතිහාසික බලකොටුව සහ විචිත්‍රවත් ආසන දෙව්මැදුර නැරඹීමට එක්වෙමින්...





රුසියාවේ සංචාරයේ නිරත ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රධානී ඇතුළු දූත පිරිස ඉකුත් ඔක්තෝබර් 28 වන දින මිහයිලොව්ස්කායා (*Mikhailovskaya*) හමුදා කාලතුවක්කු විද්‍යාපීඨයට යාබදව පිහිටා ඇති දීර්ඝකාලීන ඉතිහාසයකට උරුමකම් කියන රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග් හි පීටර් සහ පෝල් බලකොටුවේ කහ පැහැති ආසන දෙව්මැදුරේ සහ තරු හැඩැති බලකොටුවේ ද සංචාරයක නිරත වූහ.

# අභිමානවත් සෙවණේදී භාරතයේ හමුදා ප්‍රධානීට හරසර...








ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ආරාධනයකට අනුව දිවයිනට පැමිණි ඉන්දීය යුද්ධ හමුදා ප්‍රධානී ජෙනරාල් මනෝජ් මුකුන්ද් නාරාවන (*General Manoj Mukund Naravane*) පීවීඑස්එම්, ඒවීඑස්එම්, එස්එම්, වීඑස්එම්, ඒඩීසී ඉකුත් ඔක්තෝබර් 13 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාර මධ්‍යයේ මහත් හරසරින් පිළිගනු ලැබීය.

එවකට ඉන්දියානු සාම සාධක හමුදාවට අනුයුක්තව ශ්‍රී ලංකාව වෙනුවෙන් ඉමහත් සේවාවක් කළ නිලධාරියෙකු වන ඉන්දියානු යුද්ධ හමුදා ප්‍රධානී ගේ මෙම සංචාරයේ අරමුණ දෙරට අතර පවතින අන්‍යෝන්‍ය සබඳතා සහ හමුදා සහයෝගිතාවන් ශක්තිමත් කර ගැනීමයි.

ඉන්දියානු යුද්ධ හමුදා ප්‍රධානී සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති අතර පැවති සුහද හමුව අතරතුර දෙරට අතර පවතින දිගුකාලීන ද්විපාර්ශ්වික බැඳීම් සිහිපත් කෙරිණ. එහිදී, වර්ෂ 1987 දී එල්ටීටීඊ ත්‍රස්තවාදයට එරෙහිව දියත් කරනු ලැබූ මානුෂීය මෙහෙයුම් කාලසීමාව තුළ ඉන්දියානු සාමසාධක බලකායට අනුයුක්තව අණදෙන නිලධාරීවරයෙකු වශයෙන් යාපනය, කිලිනොච්චිය, මුලතිව් සහ වන්නි ප්‍රදේශයේ තිබූ දරුණු එල්ටීටීඊ ප්‍රචණ්ඩත්වයට එරෙහිව ක්‍රියා කළ ආකාරය පිළිබඳ මතකයන් ද ඔවුන්ගේ කතා බහට බඳුන් විය.







# ඉන්දීය යුද්ධ හමුදා ප්‍රධානී ගේ සංචාරයේ මතක සටහන්...



අතිගරු ජනාධිපතිතුමන් හමුවූ අවස්ථාව.



ගරු අග්‍රාමාත්‍යතුමන් හමුවූ අවස්ථාව.



ආරක්ෂක ලේකම්තුමන් හමුවූ අවස්ථාව.



ඉන්දියානු සාමසාධක හමුදා රණවිරුවන් වෙත පුෂ්පෝපහාර දක්වමින්.



මහනුවර ශ්‍රී දළදා මාලිගාව වැඳපුදා ගනිමින්.



අනුරාධපුර, තිසාවැව පිහිටි යුද්ධ හමුදා සේවා බලකා රියදුරු පුහුණු පාසලේ සංචාරය කරමින්.





යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා සහභාගී වෙමින්.



# රණවිරුවන්ගේ විනෝදාස්වාදයට කදිම තෝතැන්නක්...

දඹුල්ල, ඉනාමළුව ප්‍රදේශයේ පිහිටි 53 වන සේනාංක මූලස්ථානයේ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් විසින් ඉදිකරනු ලැබූ *'Strikers' Bay'* විනෝදාස්වාදය සඳහා වූ මධ්‍යස්ථානය පසුගිය ඔක්තෝබර් 21 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් විවෘත කෙරිණි.

1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී සහ 53 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් එම අවස්ථාවට එක්වූ යුද්ධ හමුදාධිපතිතුමාට එහිදී හමුදා සම්ප්‍රදායානුකූලව හිමිවූයේ උණුසුම් පිළිගැනීමකි.

මෙම විනෝදාස්වාදය සඳහා වූ මධ්‍යස්ථානය පොළොන්නරුව සහ අනුරාධපුර ප්‍රදේශයේ සංචාරය කරන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ පවුල් වල සාමාජිකයින් සඳහා ද විවෘතව තැබෙනු ඇත.





# අභිමන් ගමනකට උණුසුම් සුබ පැතුම්...



72 වන යුද්ධ හමුදා සංවත්සර දිනය නිමිත්තෙන් මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ යුද්ධ හමුදාවේ බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත නිල ලාංඡන පැළඳවීම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් පසුගියදා සාලියපුර පිහිටි ගජබා රෙජිමේන්තු මූලස්ථානයේදී සිදුකෙරිණි.

එහිදී, මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 08 දෙනෙකුට නිල ලාංඡන පැළඳවීය. ඒ අනුව උසස්වීම් ලැබූයේ මේජර් ජෙනරාල් එම්ආර්පී වීරසිංහ යූඑස්පී ඒටීඕ, මේජර් ජෙනරාල් ඒඑල් ඉලංගකෝන්, මේජර් ජෙනරාල් එල්සීආර් ජයසූරිය ආර්එස්පී එන්ඩීසී පීඑස්සී, මේජර් ජෙනරාල් කේපීඑස්ඒ ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී, මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී යූඑස්පී එන්ඩියූ, මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී සහ මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී යන නිලධාරීහුය.

---

# යුද්ධ හමුදාධිපති කිලිනොච්චි සහ මුලතිව් ගොවි ජනතාව හමුවෙයි...







ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් පසුගිය ඔක්තෝබර් 17 වන දින කිලිනොච්චි ප්‍රදේශයේ සංචාරයක නිරත විය. එහිදී, කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කවල විවිධ ගොවි සංගම් වල නියෝජිතයින් කිහිප දෙනෙකු සිය කෘෂිකාර්මික ගැටලු සඳහා විසඳුම් බලාපොරොත්තුවෙන් යුද්ධ හමුදාධිපති හමුවිය. එහිදී, මෙම අවස්ථාව සඳහා සහභාගි වූ ගොවි සංගම්වල සභාපතිවරු, ලේකම්වරු ඇතුළු නියෝජිතයින් විසින් මහ කන්නයේ කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීම පිළිබඳ සිය ගැටලු ඉදිරිපත් කළහ.



# ඓතිහාසික විජයබාහු නිවහනට අභිමානය කැන්දූ දිනක්...

"තම උපායෙහි ශිල්පයෙහි සහ වෘත්තියෙහි අති දක්ෂයෙකුට ඉසිලිය නොහැකි මහ බර කුමක්ද" යන තේමා පාඨය පෙරදැරි කර ගනිමින් වර්ෂ 1988 දී බෝයගනේදී ස්ථාපිත කරන ලද විජයබාහු පාබල රෙජිමේන්තුවේ නවතමයෙන් සකසන ලද සරඹ භූමිය පසුගියදා විවෘත කෙරිණ. විජයබාහු පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එස්පීකේජ් පිලපිටිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයින්ගේ ගෞරවාචාර මධ්‍යයේ එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය.

එහිදී පැවති උත්සව කටයුතු අතර, පරම වීර විභූෂණ පදක්කමෙන් පිදුම් ලැබූ වීරෝදාර විජයබාහු පාබල විරුවන් අනුස්මරණය කිරීම හා සෙසු විරුවන් වෙනුවෙන් ඉදිකරනු ලැබූ රණවිරු ස්මාරක වෙත පුෂ්පෝපහාර දැක්වීමට ද යුද්ධ හමුදාධිපති එක්විය.





සංචාරය සිහිවීම පිණිස විජයබාහු රෙජිමේන්තු අධිපති විසින් යුද්ධ හමුදාධිපති වෙත සමරු තිළිණයක් පිළිගන්වමින්.

# සුහද හමුවක මතක සටහන්...

ශ්‍රී ලංකාවට අනුයුක්ත කරනු ලැබූ නවදිල්ලියේ ස්ථාපිත ජර්මන් සමූහාණ්ඩු ජනරජ තානාපති කාර්යාලයේ හමුදා උපදේශක කපිතාන් ජෙරල්ඩ් කෝච් (*Captain Gerald Koch*) ඇතුළු නියෝජිත පිරිසක් පසුගිය ඔක්තෝබර් 04 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවූහ.

මෙම සුහද හමුවේදී ජර්මන් තානාපති කාර්යාලය විසින් වසර ගණනාවක් තිස්සේ දෙරට අතර පවත්නා ද්විපාර්ශ්වික සහයෝගීතාව සහ අවබෝධය පිළිබඳ අදහස් හුවමාරු කර ගන්නා ලදී. එසේම, කොවිඩ්-19 වෛරසය මෙරටින් තුරන් කිරීම සඳහා යුද්ධ හමුදාව දක්වන අඛණ්ඩ සහයෝගය පිළිබඳව ද දෙරට හමුදාවන් අතර පවත්නා සහයෝගීතාව සහ තාක්ෂණික දැනුම හුවමාරු කරගැනීමේ වැදගත්කම ද එහිදී අවධාරණය කෙරිණි.



---

ශ්‍රී ලංකාවට අනුයුක්ත කරනු ලැබූ නවදිල්ලියේ ස්ථාපිත ඊශ්‍රායල් තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක කර්නල් අසාෆ් මහ්ලර් (*Colonel Assaf Mahler*) පසුගිය ඔක්තෝබර් 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය.

මෙම සුහද හමුවේදී ඊශ්‍රායලය සහ ශ්‍රී ලංකාව අතර පවතින දිගුකාලීන සබඳතාවයන් සිහිපත් කළ ආරක්ෂක උපදේශකවරයා ජාතීන් දෙක අතර පවතින අන්‍යෝන්‍ය සුහදත්වය හා අවබෝධය තවදුරටත් ශක්තිමත් කිරීමේ වැදගත්කම පිළිබඳවද කරුණු අවධාරණය කළේය. එමෙන්ම, කොවිඩ් - 19 වෛරසය මෙරටින් තුරන් කිරීම සඳහා යුද්ධ හමුදාවේ අඛණ්ඩ දායකත්වය පිළිබඳව අගය කළ හෙතෙම දෙරටෙහි හමුදාවන් අතර පවතින සහයෝගීතාව සහ තාක්ෂණික දැනුම හුවමාරු කරගැනීමේ වැදගත්කම පිළිබඳව ද මෙම සුහද හමුවේදී සාකච්ඡා කරන ලදී.




---



ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අතිගරු අකීරා සුගියාමා මහතා (*Mr Akira Sugiyama*) සිය ධූර කාලය නිමාකර ශ්‍රී ලංකාවෙන් නික්ම යාමට ප්‍රථම ඉකුත් ඔක්තෝබර් 19 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය.

මෙම සුහද හමුවේදී, එතුමන්ගේ ධූර කාලය තුළ ලබාදුන් සහයෝගය වෙනුවෙන් ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති වෙත ඔහු සිය ස්තුතිය පුද කළේය.

# ඉන්දියානු දූත පිරිසක් යුද්ධ හමුදාධිපති හමුවෙයි...



ඉන්දීය ජාතික ආරක්ෂක විද්‍යාලයේ ඉගෙනුම ලබන උපාධි අපේක්ෂකයින් කණ්ඩායමක් දින පහක සුහද සංචාරයක් සඳහා පසුගිය ඔක්තෝබර් 18 වන දින ශ්‍රී ලංකාවට පැමිණියහ. මේජර් ජෙනරාල් හැරී බී. පිල්ලේ (*Hari B Pillai*) ගේ ප්‍රධානත්වයෙන් යුත් 18 දෙනෙකුගෙන් සමන්විත මෙම දූත පිරිස ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවූහ. එහිදී, වසර ගණනාවක් පුරාවට ශ්‍රී ලංකාව සහ ඉන්දීය ත්‍රිවිධ හමුදාවන් අතර අඛණ්ඩව පවතින ද්විපාර්ශ්වික සහයෝගීතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිගේ පැසසුමට බඳුන්විය.

---





# රෙජිමේන්තුවෙන් බුහුමන්...

ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක, මේජර් ජෙනරාල් කේ එන් එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 36 වැනි නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස රාජකාරි භාරගැනීම නිමිත්තෙන් පසුගිය සැප්තැම්බර් මස 25 වන දින සිය රෙජිමේන්තුවෙන් බුහුමන් ලැබීය. එම අභිමානවත් උත්සව අවස්ථාවට රෙජිමේන්තුවේ නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# නොමැකෙන දිනයක මතක සටහන්...



ඉන්දීය යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනි වීනා නාරාවන මහත්මියගේ ශ්‍රී ලංකා සංචාරය සනිටුහන් කිරීම වස් එතුමිය වෙත සමරු තිළිණයක් පිළිගැන්වීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය කටයුතු කළාය. මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සෙසු ජ්‍යෝෂ්ඨ සාමාජිකාවන් රැසක්ද එක්වූහ.







ඉන්දීය යුද්ධ හමුදාධිපති ගේ ශ්‍රී ලංකා සංචාරයට සමගාමීව එතුමන්ගේ භාර්යාව වන ඉන්දීය යුද්ධ හමුදා සේවා වනිතා (*Army Wives Welfare Association - AWWA)* සභාපතිනි වීනා නාරාවන මහත්මිය ඉකුත් ඔක්තෝබර් 13 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සංචාරයකට සහභාගි වූවාය.

ඉන්දීය යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනියගේ ශ්‍රී ලංකා සංචාරය සනිටුහන් කිරීම වස් පරිත්‍යාග බෙදාදීමේ වැඩසටහනක්ද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් සංවිධානය කරන ලදී. මේ යටතේ සන්නාහ සන්නද්ධ බලකා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වෛද්‍ය හර්ෂණී බෝතොට මහත්මියගේ සම්බන්ධීකරණයෙන් එම රෙජිමේන්තුව යටතේ රාජකාරී නියුතු තෝරාගත් රණවිරුවන් 15 දෙනෙකුගේ දුරස්ථ/මාර්ගගත අධ්‍යාපනය හදාරනු ලබන දූවා දරුවන් 15 දෙනෙකු සහ මිහිඳු සෙත් මැදුර - අත්තිඩිය සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන ආබාධිත විරෝදාර රණවිරුවන් 05 දෙනෙකු හට ටැබ් වර්ගයේ පරිගණක යන්ත්‍ර පරිත්‍යාග කෙරිණ. තවද එම ආබාධිත රණවිරුවන් 05 දෙනාගේ සහායකයින් 05 දෙනා හටද වටිනා ස්මාර්ට් ජංගම දුරකථන 05 ක් පරිත්‍යාග කිරීම ද ඉන්දීය යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය අතින් සිදුකළාය.







# සංචාරයක මතක සටහනක්...

72 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා දිනයට සමගාමීව ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියස ඉකුත් ඔක්තෝබර් 09 වන දින පැවති යුද්ධ හමුදා ධජයන්ට සෙත් පැතීමේ ආගමික උත්සවයෙන් පසු ශ්‍රී ලංකා මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය ආරක්‍ෂා කිරීම වෙනුවෙන් තම කායදානය කැපකළ අනුරාධපුර අභිමංසල 1 සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන වීරෝදාර රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීම සඳහා එක්වීමට ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය අමතක නොකළහ.

මෙම සංචාරයේදී ප්‍රතිකාර ලබන ආබාධිත රණවිරුවන් සඳහා අවැසි අත්‍යාවශ්‍ය භාණ්ඩ ඇතුළත් ත්‍යාග පාර්සල් බෙදාදීම ද යුද්ධ හමුදාධිපති ගේ සහ සේවා වනිතා සභාපතිනිය ගේ සුරතින් සිදුකෙරිණ. තවද එහිදී නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන ආබාධිත රණවිරුවෙකු විසින් දැවයෙන් නිර්මාණය කරන ලද සමරු තිළිණයක් සංකේතාත්මකව යුද්ධ හමුදාධිපති වෙත පිළිගැන්වූ අතර, රෝහල් සංචාරය සනිටුහන් කරනු වස් යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනිය වෙත සංකේතාත්මකව සමරු තිළිණයක් ප්‍රදානය කිරීමට ද සුවසහන නිකේතනයේ සේනාවිධායක විසින් කටයුතු කරන ලදී.

# සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාව...



සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය වෛද්‍ය හර්ෂණී බෝතොට මහත්මියගේ මඟපෙන්වීම යටතේ 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායට අයත් ලාන්ස් කෝප්‍රල් සේනාරත්න යූජීසීකේ යන සෙබළාගේ ආබාධිත දරුවා වෙත කෘත්‍රිම පාද ලබාදීමේ කටයුත්තක් ඉකුත් සැප්තැම්බර් 04 වන දින සිදුකරන ලදී.

# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව...



ඉංජිනේරු බලකායට අයත් කොළඹ ප්‍රදේශයට ආසන්න මූලස්ථානයන් සහ ඒකකයන් යටතේ රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහතුන් 103 දෙනෙකු වෙනුවෙන් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් මත්තේගොඩ පිහිටි එම බලකා කඳවුරෙහි දී ඉකුත් ඔක්තෝබර් 11 වන දින පවත්වන ලදී.

# සංඥා බලකා සේවා වනිතා ශාඛාව...



ඉකුත් ඔක්තෝබර් 01 වන දිනට යෙදී තිබුණු ලෝක ළමා දිනයට සමගාමීව බොරැල්ල ජයන්ති ළදරු සංවර්ධන මධ්‍යස්ථාන ළමා නිවාසයේ අවුරුදු 1 සිට 5 දක්වා දරුවන් 16 දෙනෙකු වෙනුවෙන් වියළි ආහාර සහ අත්‍යාවශ්‍ය බඩුභාහිරාදිය ලබාදීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් ඉකුත් ඔක්තෝබර් 10 වන දින සිදුකරන ලදී. මෙම අවස්ථාව සඳහා එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සජීවනි පීරිස් මහත්මිය ඇතුළු එම ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් පිරිසක් ද සහභාගි වූහ.

# පාබල හමුදා සේවා වනිතා ශාඛාව...



කොවිඩ් වසංගත තත්වය හමුවේ නව තාක්ෂණය භාවිතා කරමින් මාර්ගගතව අධ්‍යාපනය ලබන පාබල හමුදා රණවිරු දූදරුවන් හට එම රෙජිමේන්තු අධිපතිතුමන්ගේ උපදෙස් මත සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිගේ සම්බන්ධීකරණයෙන් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර සහ ටැබ් පරිගණක යන්ත්‍ර පරිත්‍යාග කිරීම පසුගිය ඔක්තෝබර් 23 වන දින සිදුකරන ලදී. පාබල හමුදා රෙජිමේන්තු මූලස්ථානයට වසර 32 ක් සපිරීම නිමිත්තෙන් පැවති අභිමානවත් සංවත්සරයට සමගාමීව මෙම කටයුත්ත සිදුවිය.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...



සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය වශයෙන් දර්ශනී ලියනගේ මහත්මිය ඉකුත් ඔක්තෝබර් 11 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සුබ මොහොතින් රාජකාරී අරඹන ලදී.

# ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාව...



ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය වශයෙන් දීපිකා ප්‍රශාන්ති චන්ද්‍රසේන මහත්මිය ඉකුත් ඔක්තෝබර් 11 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සුබ මොහොතින් රාජකාරී අරඹන ලදී.

# පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව...




ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායට අයත් කොවිඩ් 19 වෛරසය ආසාදනය වූ සිවිල් සේවක මහත්ම මහත්මීන් හට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 10 වන දින පැවැත්විණ. යුද්ධ හමුදා පොලිස් හේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවති එම අවස්ථාවට එහි සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ඉනෝකා ඉලංගකෝන් මහත්මිය ඇතුළු ජ්‍යේෂ්ඨ සාමාජිකාවන් පිරිසක් එක්වූහ.

# කෘෂිකර්ම හා පශුසම්පත් බලකා සේවා වනිතා ශාඛාව...



නවතමයෙන් ස්ථාපිත ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකායේ ප්‍රථම සේවා වනිතා සභාපතිනි ලෙස ශාන්ති අබේසේකර මහත්මිය පසුගිය ඔක්තෝබර් 17 වන දින සුබ මොහොතින් සිය ධුරයෙහි රාජකාරී අරඹන ලදී.

# මුල්ගල් තැබීමක්...



ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් හා මගපෙන්වීම මත අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියේ තවත් එක් අදියරක් ඉකුත් ඔක්තෝබර් 10 වන දිනට යෙදුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිමානවත් 72 වන සංවත්සර දිනට සමගාමීව ක්‍රියාත්මක කෙරිණ. ඒ යටතේ නවතමයෙන් ඉදිකිරීමට නියමිත නව නිවෙස් 02 ක් සඳහා මුල්ගල තැබීමේ උත්සවය ආඥාපතිගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 08 වන දින සිදුකරන ලදී.

51 සහ 52 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරුන්ගේ අධීක්ෂණය මත ඉදිකිරීමට නියමිත මෙම නිවාස දෙක සඳහා දානපති වාමදේවන් ත්‍යාගේන්ද්‍රන් මහතා සහ ශ්‍රී සත්‍ය සායි ජාත්‍යන්තර සංවිධානයේ මූල්‍ය දායකත්වය ලබාදී ඇත. 511 සහ 523 වන බලසේනා බලප්‍රදේශවලට අයත් සංගුවේලි සහ චන්ද්‍රපුරම් ප්‍රදේශයන්හි පදිංචි රාජකුමාරි දයාපරන් සහ නාගමනී සරස්වදී යන අයවලුන් වෙනුවෙන් ඉදිකිරීමට නියමිත මෙම නව නිවාසයන්හි ඉදිකිරීම් කටයුතු 9 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ සහ 4 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ භටපිරිස් විසින් සිදුකරනු ලබති.

---

# නිවාස සිහිනයක් සැබෑ කරමින්...




ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ උපදෙස් පරිදි 563 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් කේපීඒ පෙරේරා ආර්එස්පී ගේ අධීක්ෂණයෙන් නවතමයෙන් ඉදිකරන ලද නිවසක් බෝගස්වැව ග්‍රාමයේ පදිංචි අඩු ආදායම්ලාභී පවුලක් වන ජේඑම්එස් ජයලත් යන මහත්මිය වෙත 72 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව ඉකුත් සැප්තැම්බර් 25 වන දින ප්‍රදානය කරන ලදී.

7 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් හි ශ්‍රම දායකත්වයෙන් සිදුවූ මෙම නිවසේ ඉදිකිරීම් කටයුතු මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි (විශ්‍රාමික) විසින් සම්බන්ධීකරණය කරන ලදී. ලංකා මෝටර් රථ සංගමයේ සභාපති ධම්මික ආටිගල මහතා සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊට අවශ්‍ය මූල්‍ය දායකත්වය ලබාදුන්හ. නිවස පිරිනැමීමේ අවස්ථාවට ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති, 56 වන පාබල සේනාංකාධිපති, 563 වන පාබල බලසේනාධිපති, ලංකා මෝටර් රථ සංගමයේ සභාපති සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලධාරීන් ඇතුළු පිරිසක් එක්වූහ.



# කිළිනොච්චි පරිශ්‍රයේ නව මූලස්ථානයක්...

ශ්‍රී ලාංකික ජාතිය අසීරු අභියෝගයන්ට මුහුණ පාන අවස්ථා වලදී ඉන් මුදවා ගැනීම සහ ත්‍රස්තවාදීන්ට එරෙහිව හදිසි මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ හැකියාව සහිතව පිහිටවූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා 1 වන බලකායේ සමාරම්භය පසුගිය ඔක්තෝබර් 17 වන දින යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව පැවති උත්සවයක දී සනිටුහන් විය.

"ඉදිරි උපායමාර්ගික සැලැස්ම 2020 - 2025" ට අනුව ආරම්භ කළ මෙම බලකායේ මූලස්ථානය (කිලිනොච්චි) ආරක්ෂක සේනා මූලස්ථානය පිහිටි භූමි පරිශ්‍රයේ ස්ථාපිත කරන ලදී. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ උණුසුම් පිළිගැනීම් මධ්‍යයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය. එහිදී යුද්ධ හමුදාධිපති අතින් නව මූලස්ථාන සංකීර්ණය විවෘත කිරීම ද සිදුවිය.







# ඓතිහාසික 72 වන යුද්ධ හමුදා සංවත්සරය...

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 72 වන අභිමානවත් සංවත්සරය පසුගිය ඔක්තෝබර් 10 වන දිනට යෙදී තිබුණි. සාලියපුර ගජබා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදී ඒ නිමිත්තෙන් පැවති සැමරුම් උත්සවය සඳහා සුවිශේෂත්වයක් එක් කරමින් ගජබා රෙජිමේන්තුවේ කීර්තිමත් නිලධාරියෙකු වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ආරාධනයකට අනුව එලෙස සහභාගී වූ ගරු ජනාධිපතිතුමා වෙත ගජබා රෙජිමේන්තු පරිශ්‍රයේදී එහි හටපිරිස් විසින් ලබාදුන්නේ ගෞරවාන්විත පිළිගැනීමකි.





එම උත්සවයට එක්වෙමින් අදහස් දැක්වූ ජනාධිපතිතුමන් ශ්‍රී ලංකා සංඥා බලකාය සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට මෙන්ම අවසානයේ ගජබා රෙජිමේන්තුවට අනුයුක්තව තමා රාජකාරි ඉටු කළ ආකාරය පිළිබඳ සිහිපත් කළ අතර, ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා සාලියපුර භූමිය තෝරා ගැනීමට තමන් මූලිකත්වය ගෙන කටයුතු කළ බවද ප්‍රකාශ කළේය. එම රෙජිමේන්තු පරිශ්‍රයේ නව ඉදිකිරීම් සහ ගොඩනැගිලි සංකීර්ණය මෙලෙස සංවර්ධනය වීම පිළිබඳ සිය සතුට පළ කළ ජනාධිපතිතුමන් රාජ්‍ය නායකයා ලෙස පාලනය භාර ගෙන රාජ්‍ය පාලනය කිරීමට යුද්ධ හමුදා නිලධාරියෙකු ලෙස තමන් මහත් පන්නරයක් ලබාගත් බව ද ප්‍රකාශ කරන ලදී.

එහිදී, රෙජිමේන්තු මූලස්ථානයේ ස්ථාපනය කළ නව සරඹ භූමිය විවෘත කිරීමේ අවස්ථාවට ද ප්‍රධාන ආරාධිත අමුත්තා එක්විය. අනතුරුව, ජනාධිපති වර්ණ සහ රෙජිමේන්තු වර්ණ වලින් යුක්ත ගජබා රෙජිමේන්තුවේ බලඇණි 25 ට අයත් නිලධාරීන් 94 දෙනෙකුගෙන් සහ සෙසු නිලයින් 712 දෙනෙකුගෙන් සමන්විත උත්තමාචාර පෙළපාලිය ද අතිගරු ජනාධිපතිතුමන් විසින් පරීක්ෂා කරනු ලැබීය.



ජාතික සංවර්ධන කටයුතුවල ඉදිරියෙන්ම සිටින ශ්‍රී ලංකා යුද්ධ හමුදා හටපිරිස් ජාතිය ගොඩනැගීමේ ප්‍රයත්නයේ සැබෑ දායකයින් ලෙස ඉටුකරන ප්‍රශංසනීය මෙහෙවර ද ඇගයූ ජනාධිපතිතුමන් එහිදී ඉදිරිපත් කරන ලද වර්ණවත් හා ඉතා ආකර්ෂණීය පෙළපාලිය, හමුදා වෘත්තියේ ගුණාත්මකභාවය සහ ගෞරවාන්විතභාවය සංකේතවත් කරන බව ද වැඩිදුරටත් සඳහන් කරන ලදී. මෙම අවස්ථාවට ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ද සහභාගී විය.









# ශ්‍රී ලංකා යුද්ධ හමුදා 1 වන බලකාය ආරම්භ කෙරේ...

යුද්ධ හමුදාවේ "ඉදිරි උපායමාර්ගික සැලැස්ම 2020 - 2025" ප්‍රතිපත්තියට සමගාමීව ස්ථාපිත කරනු ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා 1 වන බලකායේ සමාරම්භය ඉකුත් ඔක්තෝබර් 17 වන දින උඩැසන ගජබා රෙජිමේන්තු මූලස්ථානයේදී සනිටුහන් විය.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ආරාධනාවකට අනුව මෙම සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හා ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහභාගි විය. "වේගවත්, ජව සම්පන්න, අභීතව" යන තේමාව පෙරදු කරගත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා 1 වන බලකායේ ප්‍රගමනය උදෙසා දායක වන භට පිරිස් වෙත නිල ලාංඡන පැළඳවීම සඳහා ප්‍රධාන අමුත්තා සමග යුද්ධ හමුදාධිපති සහ විධායක ජෙනරාල් ද සහභාගී වූහ. තවද, ශ්‍රී ලංකා යුද්ධ හමුදා 1 වන බලකායේ නිල වෙබ් අඩවිය ද ආරක්ෂක ලේකම් තුමන් විසින් එහිදී සංකේතාත්මකව එළිදක්වන ලදී.

අනපේක්ෂිත තත්වයන් සඳහා ඉදිරිපත් වීමට සහ හදිසි අවස්ථාවන් වලදී සක්‍රීය හමුදා ක්‍රියාකාරීන් ලෙස ක්ෂණිකව ක්‍රියාත්මක වී කටයුතු කිරීමට මෙම බලකාය ස්ථාපිත කර ඇති අතර, එහි බලකාධිපති ලෙස මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී කටයුතු කරයි. 53 හා 58 වන සේනාංක, කමාන්ඩෝ බලසේනාව, විශේෂ බලකා බලසේනාව, ගුවන් සංක්‍රමික බලසේනාව, පාබල බලසේනා සහ තවත් ඒකකයන්හි භට පිරිස් කිලිනොච්චි ප්‍රදේශයේ ස්ථාපිත ශ්‍රී ලංකා යුද්ධ හමුදා 1 වන බලකායේ ක්‍රියාන්විත කටයුතු වෙනුවෙන් සිය දායකත්වය සපයති.



අතීතයේ සිටම ශ්‍රී ලංකා යුද්ධ හමුදා අතිරේක ප්‍රහාරක බලකාය සහ විශේෂ මෙහෙයුම් බලකායන් ස්වාධීනව පවත්වා ගෙන ගියද, එම සියලු බලකායන් සම්බන්ධ කරමින් ඉහළම ගුණාත්මකභාවයෙන් යුතු උපායමාර්ගික සටන්ක්‍රමවලින් සමන්විත එක් බලකායක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා 1 වන බලකාය ස්ථාපිත කර ඇත. එතුළින් ඇතිවිය හැකි ආරක්ෂක අභියෝගයන්, ස්වභාවික විපත්, මිනිසුන් විසින් සිදුකරනු ලබන විපත්, වසංගත සහ ත්‍රස්තවාදී තර්ජන මෙන්ම ජාතික හදිසි තත්වයන් වෙනුවෙන් මෙම බලකාය ක්‍රියාකාරීව මැදිහත් වනු ඇත.

යුද්ධ හමුදාව ජාතියේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාකාරි බලවේගයක් වශයෙන් විවිධ අවස්ථාවන්හිදී ඕනෑම අභියෝගයක් භාරගැනීමට සූදානම්ව සිටින බැවින් එවන් අවස්ථාවකට අනුවර්තනය වීමේ හැකියාව ඇති බලකායක් පවත්වා ගෙන යා යුතු බවත්, ඒකාබද්ධ මෙහෙයුම් සඳහා පෙරමුණ ගැනීමට සංග්‍රාමික කටයුතු සහ සංග්‍රාමික ආධාරක වශයෙන් එම බලකාය ක්‍රියාන්විත කටයුතු වෙනුවෙන් සිය දායකත්වය සපයන බවත් යුද්ධ හමුදාධිපතිතුමන්ගේ "ඉදිරි උපායමාර්ගික සැලැස්ම 2020 - 2025" ප්‍රතිපත්තිය තුළින් ද ප්‍රත්‍යක්ෂ වේ.





# රණකාමී විරු නිවහනේ අභිමානවත් 38 වන සැමරුම

ගජබා රෙජිමේන්තුවේ අභිමානවත් 38 වන සංවත්සර සැමරුම් උත්සවය ඉකුත් ඔක්තෝබර් 14 වන දින සාලියපුර පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී අභිමානවත්ව පැවැත්විණි. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ඉන්දීය යුද්ධ හමුදා ප්‍රධානී ජෙනරාල් මනෝජ් මුකුන්ද් නාරාවන (*General Manoj Mukund Naravane*) සහභාගී විය.

එහිදී ගජබා රෙජිමේන්තුවේ සියලු බලඇණි නියෝජනය කරමින් නිලධාරීන් 42 ක් සහ සෙසුනිලයින් 520 දෙනෙකුගෙන් සමන්විත අභිමානවත් ආචාර පෙළපාලියේ ගෞරවාචාරය ඉන්දීය යුද්ධ හමුදා ප්‍රධානී වෙත පිරිනැමූහ.

මෙම උත්සවය සඳහා සපැමිණි ඉන්දියානු යුද්ධ හමුදා භාර්යාවන්ගේ සුබසාධක සංගමයේ සභාපතිනි වීනා නාරාවන මැතිනිය (*Mrs Veena Naravane*) ද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මැතිනිය විසින් මල් කළඹක් දී උණුසුම් අයුරින් පිළිගනු ලැබුවාය.

ඉන් අනතුරුව, මෙම අවස්ථාවට මතකයන් එක් කරමින් සංවත්සර දින සැමරුම් උත්සවයට සහභාගී වූ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඇතුළු ගජබා රෙජිමේන්තු ජ්‍යේෂ්ඨ නිලධාරීන් සමඟ ඉන්දීය යුද්ධ හමුදා ප්‍රධානී සමූහ ඡායාරූපයකට පෙනී සිටියහ. තවද, මෙම අවස්ථාව සනිටුහන් කරමින් එම කඳවුරු පරිශ්‍රයේ නා පැළයක් රෝපණය කිරීමට ද ඔහුතෙම කටයුතු කළේය.







මෙම උත්සවය අතරතුර දී යුද්ධ හමුදාධිපති විසින් ටෝකියෝ පැරාලිම්පික් තරඟාවලියේ රන් පදක්කම්ලාභී බලලත් නිලධාරී 1 දිනේෂ් ප්‍රියන්ත හේරත් ඉන්දිය යුද්ධ හමුදා ප්‍රධානී වෙත හඳුන්වා දුන්නේය.



එහිදී, ඉන්දියානු යුද්ධ හමුදා ප්‍රධානී ගේ සංචාරය සිහිවීම වස් ඔහු වෙත විශේෂ සමරු තිළිණයක්ද පිරිනැමිණ. මෙම සංවත්සර උත්සවය සඳහා ඉන්දියානු යුද්ධ හමුදා මූලස්ථානයේ පුහුණු අණදෙන හා මේජර් ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් රජීව් තාපර් (*Major General Rajeev Thapar*) සහ හමුදා සහායක මේජර් ජෙනරාල් වික්‍රාන්ත් නයික් (*Major General Vikrant Naik*) සහ කර්නල් මන්දීප් සිං දිල්ලන් (*Colonel Mandeep Singh Dhillon*) යන නිලධාරීහු ද සහභාගී වූහ.





# ආධුනික පාඨමාලාවක නිමාව...





යුද්ධ හමුදාව වෙත නව සාමාජිකයින් 35000 ක් බඳවා ගැනීමේ වැඩසටහනේ ප්‍රථම අදියර යටතේ බඳවාගත් ආධුනික සෙබළු 439 දෙනෙකු පසුගිය සැප්තැම්බර් 25 වන දින විසිර ගියහ. 64 වන පාබල සේනාංකයට අයත් මුතියන්කඩ්ඩුකුලම් හි පිහිටි 13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළු ආධුනික පුහුණු මධ්‍යස්ථානයේදී හා වසන්තපුරම් හි පිහිටි 14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ආධුනික පුහුණු මධ්‍යස්ථානයේ දී 2021 ජූනි 07 වන දින සිට අදාළ පුහුණුවීම් පැවැත්විණ. 641 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීපීජේසී ජයවර්ධන යූඑස්පී සහ 643 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් කේටීපී ද සිල්වා ආර්එස්පී පීඑස්සී එම සෙබළු විසිර යාමේ උත්සව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වූහ.

---

# නව ඇරඹුමක මතක සටහන්...



යුද්ධ හමුදාව වෙත ආධුනික සෙබළුන් 35000 ක් බඳවාගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව නවතමයෙන් බඳවා ගන්නා ලද ආධුනික සෙනින් 288 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුත් ආධුනික පාඨමාලා අංක 05 ඉකුත් ඔක්තෝබර් 05 වන දින තාවුල්වැව පිහිටි 22 වන පාබල සේනාංක බලඇණි පුහුණු පාසලේ දී ආරම්භ විය. එහි ආරම්භක දේශනය 223 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් සිදුකරන ලදී.



# මහ කන්නයට කාබනික පොහොර...





ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) හටපිරිස් මහ කන්නයේ කෘෂිකාර්මික අවශ්‍යතාවයන් සඳහා නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර කිලෝග්‍රෑම් 86,961 ක ප්‍රමාණයක් එම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් චන්න වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් පසුගිය ඔක්තෝබර් 26 වන දින සීමාසහිත ලංකා පොහොර සමාගම වෙත භාරදෙන ලදී. එහිදී එම පොහොර සමාගමේ සාමාන්‍යාධිකාරී ආර්.ඒ.පී. පෙරේරා මහතා වෙත සංකේතාත්මකව මෙම පොහොර තොගය පිරිනැමිණ.

මෙම අවස්ථාව සඳහා 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික, බ්‍රිගේඩියර් පාලන හා හටකාර්ය සම්පාදන, සීමාසහිත ලංකා පොහොර සමාගමේ නැගෙනහිර පළාත් සහ පොළොන්නරු දිස්ත්‍රික් ප්‍රාදේශීය කළමනාකරුවන් ද සහභාගී වූහ.



# ජන අවන්හලක්...

12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඒඩීපී රණවක ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ මඟපෙන්වීම හා අධීක්ෂණය යටතේ එම පාබල සේනාංකයෙහි අභිනවයෙන් ඉදි කරන ලද ජන අවන්හලක් පසුගිය ඔක්තෝබර් 29 වන දින සුබ මොහොතින් සියලු නිල අයිතියට පත් කෙරිණ.



# දිරියට දිරියක් වෙමින්...

17 වන ගැමුණු හේවා බළඇණිය ස්ථානගත යාපනය කයිට්ස්, වේලනි ප්‍රදේශයන්හි ග්‍රාමසේවා වසම් තුළ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් වියලි සලාක මළු තොගයක් බෙදා දීමට එහි යුද හමුදා හටපිරිස් පසුගිය සැප්තැම්බර් මස 03 වන දින කටයුතු කළහ. එම කටයුත්තට කයිට්ස් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් ද සහභාගී වූහ.

# අවැසි මොහොතේ පිළිසරණක්...




72 වන යුද්ධ හමුදා සංවත්සර දිනය සනිටුහන් කරමින් ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) සම්බන්ධීකරණයෙන් ඉදි කරනු ලැබූ නව නිවසක් වැලිකන්ද, මුතුවැල්ල ප්‍රදේශයේ වෙසෙන ආබාධිත සිවිල් කාන්තාවක වෙත ඉකුත් ඔක්තෝබර් 08 වන දින භාරදෙන ලදී. 233 වන පාබල බලසේනාව යටතේ ස්ථාපිත 9 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ භට පිරිස් වල ශ්‍රම දායකත්වයෙන් ඉදි කරන ලද මෙම නිවසට සමාජ සේවා සංවිධානයක් වන"මිහිඳු නිවහන" අරමුදල වෙතින් මූල්‍ය දායකත්වය ලබා දෙන ලදී. ආරක්‍ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සහභාගීත්වයෙන් පැවති එම නිවස භාරදීමේ අවස්ථාවට 23 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඑන්එන් කොස්වත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 233 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් වසන්ත හේවගේ, 9 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් දිනේෂ් වනිගසේකර මෙන්ම ප්‍රදේශයේ සිවිල් වැසියන් පිරිසක් ද සහභාගී වූහ.

---

# අභිමානවත් යුද්ධ හමුදා දිනය සමරමින්...




72 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව "තුරු මිතුරු නව රටක්" යන තේමාව යටතේ 1 වන බලකාය සහ සියලුම ආරක්‍ෂක සේනා මූලස්ථාන මගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි කුඹුක් පැළ 10,000 ක් එකවර රෝපණය කිරීමට සැලසුම් කෙරිණ. ඒ අනුව ආරක්‍ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එස්පීකේජ් පිලපිටිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් කුඹුක් පැළ රෝපණය කිරීම සිදුකළ අතර, ඊට එම මූලස්ථානයේ නිලධාරීන්, නිලධාරිනියන් සහ සෙසුනිලයින් රැසක් ද එක්වූහ.

# ලෝක ළමා දිනයට අරුතක් ලබාදෙමින්...






ඉකුත් ඔක්තෝබර් 01 වන දිනට යෙදී තිබුණු ලෝක ළමා දිනය වෙනුවෙන් බණ්ඩාරවෙල අඹේගොඩ "සිරි සඟබෝ ළමා නිවාසයේ" දරුවන් සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් සහ බණ්ඩාරවෙල *Pizza Hut* ආයතනයේ අනුග්‍රාහකත්වයෙන් ආහාර සහ එළවළු, විෂබීජහරණ ද්‍රව්‍ය සහ මුඛ ආවරණ බෙදාදීමේ වැඩසටහනක් පැවැත්විණ. ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මෙන්ම ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මගපෙන්වීම යටතේ එම කටයුත්ත සිදුවිය.

---

# සිංහ සමාජයෙන් පරිත්‍යාගයක්...




පනාගොඩ යුද්ධ හමුදා රෝහලේ කොවිඩ් -19 එන්නත්කරණ වැඩසටහන සිදු කරන වෛද්‍ය කාර්ය මණ්ඩලය වෙත සෞඛ්‍යාරක්ෂිත උපකරණ තොගයක් පරිත්‍යාග කිරීමට ගල්කිස්ස සිංහ සමාජයේ සාමාජික පිරිසක් ඉකුත් ඔක්තෝබර් 22 වන දින කටයුතු කළහ. අදාළ පරිත්‍යාග භාර ගැනීමේ අවස්ථාවට ආසේමු බ්‍රිගේඩියර් ප්‍රමානි, කර්නල් සම්බන්ධීකරණ නිලධාරී, *Lions Club* සංවිධානයේ සභාපති, ලේකම් සහ එහි සාමාජික පිරිසක් එක් වූහ.



# ලැජ්ජා බිය නිසා කොන්වන්න එපා....

තමන් පහත්ය යන හැඟීම සහ මුහුණ දීමේ බිය නිසා මිනිස් ඇසුරින් වෙන්වී සිටින අය ඇත. තමන්ගේ සම්පූර්ණ දක්‍ෂතාවය සහ බලය වටහා නොගෙන සමාජය ඇසුරින් ලබන ප්‍රීතිය අහිමි කර ගන්නේ ඔවුන් සමාජයෙන් වෙන් කර තබන අදෘශ්‍යමාන බලවේගයක් නිසාය. පසුගිය සය වසරක කාලය තුළ අප විසින් කරන ලද පරීක්‍ෂණ වලින් පෙනී යන්නේ ඇමරිකානු ජනතාවගෙන් සියයට 40ක් පමණ එනම් අටකෝටියක් පමණ පිරිස තමන් සමාජයෙන් වෙන්වී කොන්වී සිටින බව ඔවුන් විසින්ම පිළිගෙන ඇති බවයි. තමන්ගේ ජීවිත කාලයේ යම් යම් අවස්ථාවන් තුළදී එසේ සිටි බව පිළිගත් කැපී පෙනෙන පුද්ගලයන් අතර හිටපු ජනපති කාටර් සහ එම මැතිනියද එංගලන්තයේ චාර්ල්ස් කුමරුද සිනමා නිළි කැතරින් දුනාවේද රූපවාහිණී ශිල්පී කැරොල් බර්නට් සහ බාබරා වොල්ටර්ස්ද ක්‍රීඩක ෆ්‍රෙඩ්ලින් සහ රෙඩ් සොක්ස්ද වෙති. ප්‍රසිද්ධියේ සමාජයට මුහුණ දීමට බිය බවක් නොපෙන්වන සමාජයේ ඉහළ පෙළේ වැජඹෙන ප්‍රසිද්ධ පුද්ගලයෝ ද සමාජ බිය නමැති රෝගයෙන් පෙළෙන්නාහ.

අපගේ පර්යේෂණ අනුව පෙනී යන්නේ වැඩිහිටි වියට පැමිණ ලැජ්ජාශීලී ගතියෙන් පසුවන බොහෝ දෙනා කුඩා කාලයේදී එසේ නොසිටි බවයි. නිවසේදී පාසලේදී හෝ මිතුරන් සමග ඇසුරේදී ඇතිවූ යම් යම් සිද්ධීන් හෝ අත්දැකීම් නිසා සමාජයට මුහුණ දීමට ඇති ලැජ්ජශීලී භාවය මොවුන් වැඩිවියට පැමිණීමෙන් පසු ඔවුන් වෙත පැමිණ ඇත. අනෙක් අතට කුඩා කාලයේදී සමාජයෙන් වෙන්වී සිටීමට ප්‍රිය කළ අය වැඩිවියට පත්වීමෙන් පසුව ජනප්‍රිය පුද්ගලයන් බවට පත්වී ඇති බවද දක්නට ඇත. මොවුන් අතරින් ඉතාමත් අවාසනාවන්ත අය නම් තමන්ගේ මුළු ජීවිත කාලය තුළදීම ලැජ්ජාශීලී ගතියෙන් පසුවන අයයි.

මට ලැබී ඇති ලිපි අතර මෙවැනි අය එවන ලද හද සසලවන ලිපිද දක්නට ලැබේ. ඉන් එකක සඳහන් වන්නේ මගේ එකම බලාපොරොත්තුව ජීවිතයේ යම් දවසක බය නොවී සමාජයට මුහුණ දීමට හැකියාවක් ඇති කර ගැනීමයි. මෙසේ පවසා ඇත්තේ 70 වියෙහි පසුවන එක්තරා ආච්චි අම්මා කෙනෙක් විසිනි.

සමහර අවස්ථාවන්හිදී ලැජ්ජාශීලීභාවය වනිතාවන්ට ආභරණයක් වැනිය. එය ඔවුන් කෙරෙහි වඩාත් සිත් ඇදගන්නාසුළු තත්වයක් උදා කරයි. පසෙකට වී තැන්පත්වී නොදන්නා දෙයට කට දමන්නේ නැතිව සිටින මොවුහු හොඳ ඇහුම්කන් දෙන්නෝ වෙති.

එහෙත් ලැජ්ජාශීලී භාවය නිසා අලුත් අය මුණ ගැසීමට හෝ යහළුවන් හඳුනා ගැනීමට හෝ බාධා පැමිණේ. එමෙන්ම හේතු සාධක සහිත කරුණක් ගැන වුවද තම ප්‍රධානියා හෝ ගුරුවරයා හෝ ඉදිරියේදී අදහස් දැක්වීමද මෙවැනි ලැජ්ජාශීලීන්ට පුළුවන් කමක් නැත. තමන් ගැනම ප්‍රමාණයට වඩා සිතීම හේතු කොට ගෙන ලැජ්ජාශීලී තැනැත්තාට තමන්ගේ අදහස් සිත් කාවදින ලෙසත් ඉදිරිපත් කිරීමට අපහසු වේ. මෙය ඉතාමත් බරපතල ආකාරයෙන් බලපාන අවස්ථාවන්හිදී පාළුව, තනිකම සහ කණස්සලුභාවයද ඇති වීමට අවකාශ ඇත.

### සමාජයට මුහුණදීමට බියවීමට මූලික හේතුව කුමක්ද?

ආරක්‍ෂාව සඳහා ඇති බලවත් බලාපොරොත්තුවත් නොදන්නා යමකට අතහිත නොදී දන්නා දෙයම පමණක් දිගටම කරගෙන යාමට ඇති ආශාවත් ලැජ්ජාශීලීභාවයට හේතු වන මූලික කරුණ වශයෙන් සඳහන් කළ හැකි වේ. ජීවිතයේ විවිධ අවස්ථාවන්ට මුහුණ දෙමින් අලුත් අලුත් අත්දැකීම් ඇති කර නොගන්නා මෙවැනි අයට පාඩු සිදුවන අවස්ථා එමටය. පුස්තකාලයේ භාරකරුගෙන් එක් ප්‍රශ්නයක් ඇසීමට ඇති ලැජ්ජාව නිසා පුස්තකාලය වටේට කැරකෙමින් සෑම රාක්කයකම පොත් සොයා බලන විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ගැන මම දනිමි. තමන් දුප්පත් නමුත් ලැජ්ජාව නිසා දුප්පත් සිසුන්ට අයත් වෛද්‍ය, සමාජ සහ සුභසාධක පහසුකම් ලබා නොගන්නා ශිෂ්‍යයෝද ඇත. අනෙකක් තබා තමන්ට සෑම අතින්ම අයිතිවාසිකම් ඇති අධ්‍යාපනික පහසුකම්ද මෙවැන්නෝ ලබා නොග නිති. ලැජ්ජාශීලී පුද්ගලයන්ට එම තත්වය නැති කර ගැනීමට බොහෝ අයුරින් උදව් කිරීමට අපට පිළිවන. ඔවුහු ඔවුන්ගේ ක්‍රියාවන් ගතිගුණ සහ හැඩරුව ඉහළින් වර්ණනා කිරීම ගැන බලවත් කැමැත්තක් දක්වති. එමෙන්ම ඔවුන් පහත් ලෙස සැලකීම ගැනද ඔවුන්ගේ සිතෙහි ඇතිවන්නේ තදබල වේදනාවකි. ඔවුන් සිතා සිටින්නේ අනෙක් අය නිරතුරුවම ඔවුන්ගේ ක්‍රියාවන් විවේචනය කිරීමට බලා සිටින්නේය යනුවෙනි. එම නිසා ඔවුහු ඔවුන්ගේ විනිශ්චයකාරයන් වන

අනෙක් මිනිසුන් ඉදිරියේ නිතරම පසු වන්නේ අපහසුවෙනි.

එබැවින් දෙමාපියන් විසින් කළ යුත්තේ කුඩා අවදියේදී තමන්ගේ දරුවාට කොන්දේසි විරහිතව ආදරය කරුණාව දක්වන බව පෙන්වීමයි. ඔහුගේ වටිනාකම රඳා පවතින්නේ ඔහු දූනට දක්වන දක්ෂකම අනුව හෝ සමාජයේ මිනිසුන් විසින් ඔහු ගැන දක්වන ආකල්ප අනුව නොවන බව ඔහුට පැහැදිලි කර දිය යුතුය. ඔහු විසින් ලබාගන්නා ලද ජයග්‍රහනය ඇතත් නැතත් ඔහුගේ හැඩරුව කුමක් වුවත් තරුණ අයෙකුගේ හෝ මහළු අයෙකුගේ වටිනාකමක් ඇති බව ඔවුන්ට අවබෝධයක් දිය යුතුය.

ලැජ්ජාශීලී පුද්ගලයෝ තමන් කරන රැකියාවේ වුවද එවැනි ලැජ්ජාශීලීභාවයක් නොමැති අයට වඩා අසහනයෙන් අසතුටින් පසුවෙති. තමන්ගේ වැඩ කටයුතු අගය කරනු ලැබීමට ඔවුහු ලැදියාවක් දක්වති. එහෙත් ලැජ්ජාශීලී බව හේතු කොට ගෙන ඉදිරිපත් වීමේ බිය නිසා තමන් කොන්වී ඇතැයි යනුවෙන් තම සිත් තුළ පැලපදියම් වී තිබීම ඔවුනට මුහුණ දීමට සිදුව ඇති බැරෑරුම් තත්වයකි. ලැජ්ජාශීලීභාවය නැතිකර ගැනීමට කළ යුත්තේ කුමක්ද? සමාජයට ඉදිරිපත් වීමේදී දක්වන බිය අධිකනම් එය නැති කර ගැනීම සඳහා ඔහු කළයුත්තේ මනෝ විද්‍යාඥයෙකුගේ උපදෙස් ලබාගැනීමයි. සමාජයට මුහුණදීමට ඇති අස්ථාන බිය පාලනය කර ගනිමින් තමන් පහත්ය යන හැඟීම් නැති කර ගැනීමට පියවර ගතයුතු වේ. තමන් විසින්ම තමන් පහත් කරගනිමින් කරන කතා වහාම නවත්වන්න. ඒ වෙනුවට තමන්ගේ වැරදි ඇත්නම් එම වැරදි නිවැරදි කර ගනිමින් පෙරටම පියවර තබන්න. එවිට ඔබ සමාජයේ ජනප්‍රිය පුද්ගලයෙකු වනු නොඅනුමානය.

***"READERS DIGEST"* ඉංග්‍රීසි සඟරාව වෙත පිලිප් ඩිම්බ්‍රාර්ඩෝ විසින් සැපයූ ලිපියක සිංහල පරිවර්තනයකි.**

# විරු සවියෙන් නව නිවසක්...



යුද්ධ හමුදා දිනයට සමගාමීව 663 වන පාබල බලසේනාවට අයත් ජයපුරම් උතුර ප්‍රදේශයේ ජීවත්වන සේසුනාදන් සුසෙයිවරි සහ වේරාවිල් පූනරින් ප්‍රදේශයේ ජීවත්වන අමලදාස් ප්‍රැන්සිස් ක්‍රිෂ්ටි යන අයවලුන් හට නව නිවෙස් ඉදිකර දීම ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එස්පීකේජ් පිලපිටිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 09 වන දින සිදුකෙරිණ. මෙහිදී නිවාසලාභීන්ට අවැසි ගෘහ භාණ්ඩ ලබා දීමටද කටයුතු කෙරිණ. මෙම නිවාස ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය 11 වන ගජබා රෙජිමේන්තුව සහ 2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භටපිරිස් විසින් ලබාදුන්හ. මෙම අවස්ථාවට 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 663 වන පාබල බලසේනාධිපති, 11 වන ගජබා රෙජිමේන්තුවේ සහ 2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරීන් ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගි වූහ





141 වන පාබල බලසේනා මූලස්ථාන බලප්‍රදේශයේ හගවත්ත, බදුරාගොඩ ගම්මානයේ "සෙවණක් වෙමු පදනම" හි මූල්‍ය දායකත්වය මත ඉදිකරන ලද නිවසක ඉදිකිරීම් නිමකර නිවැසියන් වෙත භාරදීම ඉකුත් ඔක්තෝබර් 21 වන දින 141 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණ.



# කන්දකාඩු කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය

රසායනික පොහොර භාවිතයෙන් මුළුමනින්ම ඉවත්වී කාබනික පොහොර පමණක් භාවිතා කිරීමේ ජාතික ප්‍රතිපත්තියට අනුගත වෙමින්, එම ගමනට උර දීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවද එක්ව සිටී. ඒ අනුව කෘෂිකර්ම සහ පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම මත 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බළකාය මගින් පාලනය කරනු ලබන කන්දකාඩු යුද්ධ හමුදා ගොවිපළ මගින් ආරම්භ කරන ලද කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය මුළු රටටම ආදර්ශයක් වෙමින් එම යුද්ධ හමුදා ගොවිපළෙහි කොම්පෝස්ට් අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට සමත්ව ඇත. ගොවිපළ අපද්‍රව්‍ය මෙන්ම ප්‍රාදේශීයව සපයා ගත හැකි අමුද්‍රව්‍ය යොදා ගනිමින් හා නවීන යන්ත්‍රෝපකරණයන්හි දායකත්වය ඇතිව නව තාක්ෂණික ක්‍රමවේද තුළින් උසස් ප්‍රමිතියෙන් යුතුව මෙම කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරයි. මේ වන විට දෛනිකව කොම්පෝස්ට් ටොන් 02 ක් නිෂ්පාදනය කරනු ලබන අතර එළැඹෙන මහ කන්නය සඳහා මෙන්ම මෙම ගොවිපළෙහි ක්‍රියාත්මක වීමට නියමිත ඉදිරි වගා ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය කොම්පෝස්ට් ප්‍රමාණය ලබාදීමට මෙම ව්‍යාපෘතිය මගින් කටයුතු කරනු ලබයි.

## කොම්පෝස්ට් නිෂ්පාදනය

අමු ද්‍රව්‍ය - (ශාක ද්‍රව්‍ය)

පිදුරු, තණ කොළ, රතිල ශාක ඉපනැල්ල, ග්ලිරිසීඩියා, වල්සූරියකාන්ත, ගංසූරිය, එරබදු, ඉපිල් ඉපිල්, ගොවිපළ අමුද්‍රව්‍ය, මුලුතැන්ගෙය අපද්‍රව්‍ය, ජලජ ශාක

**අමු ද්‍රව්‍ය - (සත්ව අපද්‍රව්‍ය)**

ගොම, කුකුල් පොහොර, එළු පොහොර, ඌරු පොහොර, ගුවානෝ පොහොර (වවුල් පොහොර)

**කොම්පෝසට් ටොන් 1 ක් නිෂ්පාදනය කර ගැනීම සඳහා අවශ්‍ය පරිමානය**

උස අඩි 5 x පළල අඩි 5 x දිග අඩි 15

**ගුණාත්මකභාවය පවත්වා ගැනීම**

- පළල අඩි 5-6 කට වඩා නොවිය යුතුය.
- උස සහ දිග අමුද්‍රව්‍ය සුලභතාවය මත තීරණය කළ හැකිය.
- කොම්පෝස්ට් ටොන් 1 කට මුහුම් කිලෝ 20 ක් යෙදිය යුතුයි.
- කොම්පෝස්ට් ටොන් 1 කට එප්පාවල රොක් පොස්පේට් කිලෝ

50 ක් යෙදිය යුතුය. (පොස්පරස් ප්‍රමාණය වැඩි කරගැනීම)

- තෙතමනය පවත්වාගත යුතුය.
- වැසීමට කළු ඉටි රෙද්දක් හෝ පොලිසැක් බෑග් හෝ වියා ගත් පොල් අතු සපයා ගන්න.

## භෞතික ලක්ෂණ

***පැහැය*** - කළු/අළු පැහැයට හුරු තද

***ගබඩා කළ හැකි කාලය*** - කාමර උෂ්ණත්වයේ අවම ලෙස මාස 12 ක්

***තෙතමනය*** - වියළි බරෙන් 25%කට වඩා තෙතමනය අඩු විය යුතුයි.

***සන්දය*** - අප්‍රසන්න දුගඳක් නොතිබිය යුතුයි.

***අංශු වල ප්‍රමානය*** - මි.මී. 4 දැලකින් හැලූ විට 2% කට වඩා ඉතිරි නොවිය යුතුයි.

***වැලි ප්‍රමාණය*** - වැලි 10% කට වඩා අන්තර් ගත නොවිය යුතුයි.

***රසායනික ලක්ෂණ*** - කාබන් සහ නයිට්‍රජන් අතර අනුපාතය 10 - 25 දක්වා තිබිය යුතුය.

***පී. එච්. අගය***

6.5 - 8.5 විය යුතුය.

## පෝෂ්‍ය පදාර්ථ

| ගුණාංගය | මුළු බරෙන් % |
|---|---|
| කාබන් | 20 |
| නයිට්‍රජන් | 1.0 |
| පොස්පරස් $P_2O_5$ | 0.5 |
| පොටෑසියම් $K2_+O$ | 1.0 |
| මැග්නීසියම් $MgO$ | 0.5 |
| කැල්සියම් $CaO$ | 0.7 |

## නිෂ්පාදන පියවරයන්

***පියවර*** 1 - අමුද්‍රව්‍ය රැස් කිරීම

***පියවර*** 2 - අමුද්‍රව්‍ය කුඩා කොටස් වලට කැපීම

***පියවර*** 3 - කොම්පෝස්ට් ගොඩ සෑදීම

***පියවර*** 4 - කොම්පෝස්ට් ගොඩ පෙරලීම

***පියවර*** 5 කොම්පෝස්ට් හැලීම සහ ඇසුරුම් කිරීම

***යන්ත්‍ර - සූත්‍ර අවශ්‍යතා***

කැබලි කිරීමේ යන්ත්‍රය

කොම්පෝස්ට් ගොඩ පෙරලීමේ යන්ත්‍රය

කොම්පෝස්ට් හැලීමේ යන්ත්‍රය

### කොම්පෝස්ට් ගොඩ සෑදීම

***පළමු ස්ථරය ලෙස රළු අමු ද්‍රව්‍යයක් යොදා ගනී.***

උදා :- පිදුරු, තණකොල ඉපනැල්ල


***දෙවන ස්ථරය ලෙස දිරාපත් වන ශාක අපද්‍රව්‍ය හෝ සත්ව අපද්‍රව්‍ය අඟල් 4 ක් වන සේ යොදා ගත යුතුය.***

උදා :- ශාක - ජපන් ජබර, ග්ලිරිසීඩියා සහ සත්ව - ගොම, කුකුල් පොහොර

***තුන්වන ස්ථරය ලෙස දිරාපත් වන ශාක හෝ සත්ව පොහොර ස්ථරයක් යොදා ගත යුතුයි. දෙවන ස්ථරය ලෙස ශාක ද්‍රව්‍ය යොදා ගත්තේ නම් මේ සඳහා සත්ව පොහොර යොදා ගත යුතුය.***

ඉන් පසු ජලය යොදමින් අවශ්‍ය තෙතමනය ලබා දීමෙන් පසු ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා එප්පාවල රොක් පොස්පේට් (ඊ.ආර්.පි) එම ස්ථරය මත විසුරුවා හැරිය යුතුය. මෙමගින් අවශ්‍ය පොස්පරස් ප්‍රමාණය ලබා දිය හැකිය. කොම්පෝස්ට් ටොන් 1 ක් සඳහා ඊ.ආර්.පී. කිංග්‍රෑම් 50 ක ප්‍රමාණයක් ස්ථර කිහිපයක් තුළ විසිරුවා හැරිය යුතුය.

# කොම්පෝස්ට් ගොඩක සිරස් පැතිකඩ




- මුහුම් යොදා ගැනීම මෙහි තවත් විශේෂ කාර්යයක් වන අතර, මුහුම් ලෙස පැරණි කොම්පෝස්ට් කිලෝ 20 ක් ටොන් 1 ක කොම්පෝස්ට් ගොඩක් සඳහා ස්ථර හතරකට වරක් විසුරුවා හැරීම හෝ අමු ගොම සහ ගව මූත්‍රා සමග පරණ කොම්පෝස්ට් මිශ්‍ර කර දින 03 ක් තබා සාදා ගන්නා ලද එම පල්පය යෙදීම තුළින් එහි කොම්පෝස්ට් නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන ක්ෂුද්‍ර ජීවීන් වැඩි ප්‍රමාණයක් හඳුන්වා දිය හැකිය.
- මේ ආකාරයෙන් තට්ටු කිහිපයක් යොදා ගනිමින් මෙම ගොඩෙහි උස අඩි 5 ක් පමණ වූ පසු ගොම හෝ වෙනත් සත්ව පොහොරක් භාවිතා කර අවසන් ස්ථරය යොදා කළු පොලිතින් හෝ පොලිසැක් බෑග් හෝ වියාගත් පොල් අතු මගින් ආවරණය කර ගන්න. මෙහිදී සම්පූර්ණයෙන්ම කොම්පෝස්ට් ගොඩ ආවරණය නොකළ යුතු අතර, බිම් මට්ටමේ සිට අඩි 1 ක් ඉතිරි වනසේ වැසිය යුතුය. (සම්පූර්ණ ගොඩ ආවරණය කළ හොත් බැක්ටීරියා ක්‍රියාකාරීත්වයට අවශ්‍ය වාතය කොම්පෝස්ට් ගොඩට ඇතුළු නොවේ)

■ වැස්ම ඉවත් කර උල් කර ගත් ලීයක් ගොඩ තුළට ඇතුල් කර නැවත එය එළියට ගෙන එළියේ කෙළවර අත ගා බැලීමෙන් ගොඩේ තෙතමනය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිවේ. ලීය වියළි බවින් යුක්ත නම් ජලය එකතු කළ යුතුය. තෙත් බවින් යුක්ත වේ නම් ජලය ප්‍රමාණවත් බව දළ වශයෙන් නිශ්චය කර ගත හැක.



කොම්පෝස්ට් ගොඩක් ආවරණය කිරීම

### ගොඩ පෙරලීම

කොම්පෝස්ට් ගොඩ සකස් කළ දින සිට මසකට වරක් පෙරලා නැවත ගොඩ ගැසීම කළ යුතු අතර තුන් වන පෙරලීම සිදුවන විට කොම්පෝස්ට් නිෂ්පාදනය අවසන්වී වගාවන් සඳහා යෙදිය හැකි තත්ත්වයට පත්වේ.

වෙළඳපොළ වෙත කොම්පෝස්ට් අලෙවි කරන්නේනම් මි.මී. 4 කොටු දැලකින් හලා ගැනීමෙන් අනතුරුව ඇසුරුම් කළ යුතුය.

*ව්‍යාපෘති භාර නිලධාරී - කපිතාන් ඩබ් ඒ ඒ කේ වයි වික්‍රමසිංහ*
*2 (සේ) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකාය*

# කෘෂිකර්මාන්තයට අත්වැලක් වෙමින්...



"සෞභාග්‍යයේ දැක්ම" සංකල්පයට ඉඳුරාම දායකත්වයක් ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ බලකාධිපති බ්‍රිගේඩියර් එච්ඒපීපීකේ හේවාවසම් ගේ සංකල්පයකට අනුව වී කිලෝ ග්‍රෑම් 100,000 ක් පමණ ගබඩා කර තබා ගත හැකි ගබඩා සංකීර්ණයක් සහ වී කිලෝ ග්‍රෑම් 1,000 ක් පමණ එකවර වියළිය හැකි වර්ග අඩි 2,000 ක පමණ වපසරියකින් සමන්විත කමතක් අල්ල කන්තලේ පිහිටි පොදුසේවා බලකා අනුබණ්ඩයේ ස්ථාපිත කෙරිණ. එහි හට පිරිස්හි ශ්‍රම දායකත්වයෙන් එම අනුබණ්ඩයේ නිලධාරී අණදෙන මේජර් ඩබ්ලිව්ආර්එස්පී ප්‍රසන්න ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සකසන ලද එම වී ගබඩාව සහ කමත ඉකුත් ඔක්තෝබර් 02 වන දින 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි විසින් විවෘත කරන ලදී.

# හරවත් වැඩමුළුවක්...

ආරක්ෂක සේනා (යාපනය) ආඥාපතිගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව කාබනික පොහොර සැකසීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් යාපනය දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂිකා ඒ සකිලා භානු මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 05 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) හිදී පැවැත්විණ. මෙම වැඩමුළුවට ගුණාත්මක භාවයෙන් යුත් කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව හරවත් දේශනයක් මෙන්ම තාක්ෂණික දැනුම පිළිබඳව ප්‍රායෝගික වැඩමුළුවක් ද ඇතුළත් විය.



# විරූ දෑතින් සෙවණ සැදි වගයි...

ඊසාන දිග මෝසම් වැසි සමය ආරම්භ වීමට පෙර තම නිවසේ වහල සෙවිලි කර දෙන ලෙස වාකරේ ප්‍රදේශයේ පදිංචි කනේෂන් ජනේෂ්වරී යන මහත්මිය පසුගිය දිනෙක යුද හමුදාවෙන් ඉල්ලීමක් කළාය. ඊට ප්‍රතිචාර දක්වමින් 233 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් වසන්ත හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් මත එම පාබල බලසේනාවේ භටපිරිස් විසින් අදාළ නිවසේ වහලය දින දෙකක් වැනි කෙටි කාලයක් තුළ ප්‍රතිසංස්කරණය කර නිවෙස් හිමියන් වෙත භාරදීමට කටයුතු කළහ.



# ආපදාවන් මැඩලමින්...

පවතින කාලගුණික තත්ත්වයත් සමඟ කන්තලේ ජල පවිත්‍රාගාරයේ ජල මට්ටම පහළ ගොස් තිබිණ. ඒ හේතුවෙන් කන්තලේ ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ ඉල්ලීමකට අනුව මහවැලි ගඟේ සිට කන්තලේ ජල පවිත්‍රාගාරය දක්වා ජලය රැගෙන යාමේ හදිසි පියවරක් ලෙස තාවකාලික ජලාප්‍රවාහන මාර්ගයක් 22 වන පාබල සේනාංකයේ භට පිරිස් විසින් වැලි කොට්ට අතුරා කඩිනමින් සකස් කළහ. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස ජල පරිභෝජකයින් 15,000 කට වැඩි පිරිසකට පිරිසිදු පානීය ජලය අඛණ්ඩව ලැබෙනු ඇත.



# පවස නිවන විරූ සත්කාරයක්...

විවිධ දුෂ්කරතා මධ්‍යයේ දිවි ගෙවන පවුල් 125 කට පමණ අවශ්‍ය පානීය ජල පහසුකම් සපයමින් මඩකලපුව, රජතුරෙයිනගර් පුල්ලෙයාර් කෝවිල ප්‍රදේශයේ පානීය ජල සැපයුම් ස්ථානයක් ස්ථාපිත කිරීමට 4 වන ගැමුණු හේවා බලඇණියේ භට පිරිස් කටයුතු කළහ. මෙම ජල සැපයුම් මධ්‍යස්ථානය පසුගියදා පැවති උත්සවයකදී සිවිල් වැසියන් වෙත භාරදෙන ලද අතර, එම අවස්ථාවට 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, 4 වන ගැමුණු හේවා බලඇණියේ අණදෙන නිලධාරි ඇතුළු එම ඒකකයේ නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් සහභාගි වූහ.





## ජනපතිවරයෙකු, ආරක්ෂක ලේකම්වරුන් දෙදෙනෙකු සහ යුද්ධ හමුදාධිපතිවරයෙකු බිහිකළ ගජබා රෙජිමේන්තුවට

# වසර 38 යි

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අද වනවිට ජාතියට ඉටු කරන්නේ සුළුපටු සේවයක් නොවේ. එදා තිස් වසරක් පැවති ත්‍රස්තවාදී ගිනිදැල් මානුෂීය මෙහෙයුමකින් නිවා දමා ජාතියට නිදහස් හසරැල් උදාකර දී මුළු ශ්‍රී ලංකාවම ඒකඡත්‍ර කිරීමේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දැක්වූ දායකත්වය කොතරම් දැයි කියා නිමකළ නොහැක. 1949 වර්ෂයේ දී ආරම්භ කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අද වන විට වසර 72 ක් පුරාවට ශ්‍රී ලංකා මාතාව වෙනුවෙන් සේවය කර ඇත.

යුද්ධය අවසන්වීමෙන් අනතුරුව ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘති වලදීද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විනය ගරුක ශ්‍රම බලකායක් ලෙසින් දැක්වූ දායකත්වය අතිමහත්ය. මෙලෙස සුවිශේෂී සේවාවක් කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අද වන විට රෙජිමේන්තු 25 කින් සමන්විතය. ඒ රෙජිමේන්තු අතරින් සුවිශේෂීම රෙජිමේන්තුවක් වන ගජබා රෙජිමේන්තුවේ 38 වැනි සංවත්සරය පසුගිය ඔක්තෝබර් 14 දිනට යෙදී තිබුණි. ගජබා රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සුවිශේෂීම රෙජිමේන්තුවක් ලෙස හැඳින්වීමට ද හේතුවක් තිබේ. ඒ වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්, ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහ වර්තමාන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ගජබා රෙජිමේන්තුවේ සාමාජිකයින් වීමත් නම ඇසූ පමණින් ත්‍රස්තවාදීන් සළිත වූ ගජබා රෙජිමේන්තුවේ සැබෑ රණකාමීන් වීමත් නිසාය. ඒ අනුව ජනාධිපතිවරයෙකු, ආරක්ෂක ලේකම්වරුන් දෙදෙනෙකු මෙන්ම යුද්ධ හමුදාධිපතිවරයෙකු බිහිකළ එකම රෙජිමේන්තුව ගජබා රෙජිමේන්තුවයි.

1983 වර්ෂයේදී 1 වන රජරට රයිෆල් බළඇණිය හා 1 වන විජයබාහු පාබළ රෙජිමේන්තුව ඒකාබද්ධ කර නව ඒකකයක් ස්ථාපනය කරන ලදී. මෙම බළඇණිය රජරට පුරාණ රජවරුන්ගේ රාජධානියෙහි පිහිටවූ බැවින්, ඒ සඳහා සුදුසු නාමයක් ලබාදීමේදී යුද්ධ ශිල්පයේ නිපුණ රණශූරයෙකු වූ





**2019.08.18 දින යුද්ධ හමුදාධිපති ධූරයට පත් වූ ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා 38 වසරක ගජබා රෙජිමේන්තු ඉතිහාසය තුළ රෙජිමේන්තුව වෙතින් යුද්ධ හමුදාධිපති ධූරය සඳහා පත්වූ පළමු ජ්‍යේෂ්ඨ නිලධාරීවරයා ලෙස ඉතිහාසයට එක්විය. ගජබා රෙජිමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව ඉදුරාම එම රෙජිමේන්තුවට නිලධාරියෙකු ලෙස පත්වූ පළමු නිලධාරියා මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ සිටින විවිධ පදක්කම්ලාභී නිලධාරීන් අතරින් වැඩිම වීර පදක්කම්ලාභී නිලධාරියා වන ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභීත නිලධාරීන් සඳහා ප්‍රදානය කරන ලද ත්‍රිවිධ පදක්කම් වන වීර වික්‍රම විභූෂණය, රණවික්‍රම පදක්කම හා රණශූර පදක්කම් ආදී පදක්කම් ත්‍රිත්වයම දෙවන ලුතිනන්වරයෙකු වශයෙන් සිටියදීම ලබාගත් සුවිශේෂී එඩිතර නිලධාරියෙකි.**



"ඇතෙකුට සමාන ශක්තිමත් හස්තයක් ඇති" යන අරුත ඇති ලංකා ඉතිහාසයේ රණශුරත්වයෙන් කෙළ පැමිණි රජෙකු වූ ගජබා නරේන්ද්‍රයාණන්ගේ නාමයෙන් "ගජබා" ලෙස නම්කොට, 1 වන බළඇණිය ගජබා රෙජිමේන්තුව නමින් 1983 ඔක්තෝබර් මස 14 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්විය. මෙහි ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් එවකට ලුතිනන් කර්නල් විජය විමලරත්න පත් කරන ලදී. පසුකාලීනව අරාලි තුඩුවේදී එල්ටීටීඊය විසින් ඇටවූ පීඩන බෝම්බයකට ගොදුරු වී ජීවිතක්ෂයට පත් වූ එම නිලධාරී ගජබා රෙජිමේන්තුවේ පියා වශයෙන් පිදුම් ලබයි.

ගජබා රෙජිමේන්තුව බළඇණියක් වශයෙන් උපත ලැබුවද, ගජබා සෙබළුන් ලෙස හඳුනාගැනීම සඳහා සිරස්ක ලාංඡනයක් සහ උද්‍යෘත පාඨයක අවශ්‍යතාවය ඇතිවූ බැවින් මෙම නව බළඇණිය වෙනුවෙන් සිරස්ක ලාංඡනයක් නිර්මාණය කිරීම සඳහා මහත් කැපවීමෙන් කටයුතු කළ රෙජිමේන්තුවේ නිර්මාතෘ එවකට ලුතිනන් කර්නල් විජය විමලරත්න ගේ සංකල්පයක් අනුව, උද්‍යෘත පාඨය වශයෙන් "සමගිය ශක්තියයි" යන්න භාවිතා කරන ලදී.

සිරස්ක ලාංඡනය ගජබා රජු යුද්ධ කටයුතු සඳහා භාවිතා කළ කෙටේරිය, පළිහ සහ බෙහෙත් අඟ ඇතුළත් කර කලාත්මකව නිර්මාණය කිරීමෙන් අනතුරුව, සිරස්ක ලාංඡන පැළඳවීම 1984 මාර්තු මස 30 වන දින සාලියපුර කඳවුරේදී උත්සවාකාරයෙන් සිදුවිය.

1987 වසරේ මැද භාගයේදී යාපනය අර්ධද්වීපය බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගෙන් මුදවා ගැනීමේ අරමුණින් යුද්ධ හමුදාව විසින් දියත් කරන ලද දැවැන්ත ක්‍රියාන්විතයක් වන වඩමාරච්චි මෙහෙයුම සඳහා ගජබා රෙජිමේන්තුවේ 1 වන බළඇණිය හා 3 වන බළඇණිය ඉදුරාම තම දායකත්වය ලබාදී යුද්ධ හමුදාවේ ධෛර්ය හා ශක්තිය උපරිම මට්ටමකට ගෙන ඒමට සමත්විය. මෙහිදී 1 වන ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී වශයෙන් සිටි එවකට කර්නල් විජය විමලරත්න ප්‍රථම වතාවට බලසේනාධිපතිවරයෙකු වශයෙන් අණ දුන් අතර, දෙවන අණදෙන නිලධාරීව සිටි වත්මන් අතිගරු ජනාධිපති එවකට මේජර් ගෝඨාභය රාජපක්ෂ විසින් 1 වන බළඇණියෙහි භට පිරිස් සඳහා අණ දීම සිදු කරන ලදී.

2006 වසරේ පළමු වරට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාම සාධක හමුදා රාජකාරීන් සඳහා ගජබා රෙජිමේන්තුවට අයත් සියලු නිත්‍ය හා ස්වේච්ඡා බළඇණි වලින් සමන්විත වනසේ නිලධාරීන් 35 ක් සහ සෙසුනිලයින් 523 කින් සමන්විත සාමසාධක බළඇණියක් 2006 ජුනි මස 05 වන දින සිට 2006 දෙසැම්බර් මස 19 දින දක්වා හයිටි රාජ්‍යයේ රාජකාරීන් සඳහා පිටත්ව යන ලදී. 2007 ක් වූ ජනවාරි මස 16 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් යුද්ධ හමුදා මූලස්ථාන සරඹ භූමියේදී ජනාධිපති වර්ණ සහ රෙජිමේන්තු වර්ණ ගජබා රෙජිමේන්තුවට ප්‍රදානය කරන ලදී.

2019.08.18 දින යුද්ධ හමුදාධිපති ධූරයට පත් වූ ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා 38 වසරක ගජබා රෙජිමේන්තු ඉතිහාසය තුළ

රෙජිමේන්තුව වෙතින් යුද්ධ හමුදාධිපති ධූරය සඳහා පත්වූ පළමු ජ්‍යෙෂ්ඨ නිලධාරිවරයා ලෙස ඉතිහාසයට එක්විය. ගජබා රෙජිමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව ඉදුරාම එම රෙජිමේන්තුවට නිලධාරියෙකු ලෙස පත්වූ පළමු නිලධාරියා මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ සිටින විවිධ පදක්කම්ලාභී නිලධාරීන් අතරින් වැඩිම වීර පදක්කම්ලාභී නිලධාරියා වන ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභීත නිලධාරීන් සඳහා ප්‍රදානය කරන ලද ත්‍රිවිධ පදක්කම් වන වීර වික්‍රම විභූෂණය, රණවික්‍රම පදක්කම හා රණශූර පදක්කම් ආදී පදක්කම් ත්‍රිත්වයම දෙවන ලුතිනන්වරයෙකු වශයෙන් සිටිය දීම ලබාගත් සුවිශේෂී එඩිතර නිලධාරියෙකි.

එමෙන්ම ගජබා රෙජිමේන්තුවට අයත් කීර්තිමත් ජ්‍යෙෂ්ඨ නිලධාරිවරයෙකු මෙන්ම 1 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවේ හිටපු අණදෙන නිලධාරි වරයෙකු වූ කර්නල් ගෝඨාභය රාජපක්ෂ (විශ්‍රාමික) මැතිතුමන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හත්වන විධායක ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්විය.

තවද ගජබා රෙජිමේන්තුවේ තවත් දක්ෂ එඩිතර නිලධාරියෙකු මෙන්ම හිටපු රෙජිමේන්තු අධිපතිවරයෙකු වූ ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) 2019.11.20 දින ආරක්ෂක අමාත්‍යාංශයේ නව ආරක්ෂක ලේකම්වරයා ලෙස පත්විය.

ත්‍රස්තවාදය මව්බිමෙන් තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 1983 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාල සීමාව තුළ දියත් කරන ලද සියලුම ක්‍රියාන්විතයන් සඳහා සිය උපරිම දායකත්වය ලබාදී ඇති ගජබා රෙජිමේන්තුවට අයත් සාමාජිකයින් අතරින් නිලධාරීන් 175 ක් සහ සෙසුනිලයින් 4075 දෙනෙකු මව්බිමේ නිදහස වෙනුවෙන් සිය ජීවිතය පුද කර ඇති අතර, නිලධාරීන් 180 ක් සහ සෙසුනිලයින් 4030 දෙනෙකු එහිදී රණක්ෂිතයට පත්ව ඇත.

ත්‍රස්තවාදයෙන් මව්බිම බේරාගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ වඩමාරච්චි, ත්‍රිවිධ බලය, අකුණු පහර, ජයසිකුරු, සත්ජය, රිවිරැස ආදී වූ දැවැන්ත ක්‍රියාන්විත වලදී මෙන්ම නැගෙනහිර සහ වන්නි මානුෂීය මෙහෙයුම් වලදී ගජබා රෙජිමේන්තු සාමාජිකයින් රණබිමේදී දක්වන ලද සුවිශේෂී වීරක්‍රියාවන් ඇගයීමට ලක් කරමින් පරම වීර විභූෂණ පදක්කම් 04 ක්, වීරෝධාර විභූෂණ පදක්කම් 03 ක්, වීර වික්‍රම විභූෂණ පදක්කම් 65 ක්, රණ වික්‍රම පදක්කම් 774 ක්, රණශූර පදක්කම් 3829 ක්, විශිෂ්ට සේවා විභූෂණ පදක්කම් 12 ක්, උත්තම සේවා පදක්කම් 682 ක් වීරෝදාර ගජබා නිලධාරීන් සහ සෙසුනිලයන් වෙත ප්‍රදානය කර ඇත.

**ගජබා රෙජිමේන්තුවේ 38 වැනි සංවත්සරයට අපෙන් සුබ පැතුම්.**



*ලුතිනන් දිලංක ගුණතිලක*
*ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය*

# අභිමානවත් ඇරඹුමක මතක සටහන්...





*Army Way Forward Strategy - 2020 - 2025* සංකල්පයට අනුව උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි බඳවා ගන්නා ලද දමිළ, මුස්ලිම් හා සිංහල තරුණයින් 233 දෙනෙකුගෙන් සමන්විත ආධුනික පුහුණු පාඨමාලාව බළඇණි පුහුණු පාසල විඩත්තපලෙයි හිදී ඉකුත් ඔක්තෝබර් 07 වන දින ආරම්භ කරන ලදී.

යුද්ධ හමුදාවේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා ශාරීරිකව, මානසිකව හා සදාචාරාත්මකව ශක්තිමත් වෘත්තීය සෙබළුන් බිහි කිරීම අරමුණු කරගනිමින් ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ගේ මඟපෙන්වීම යටතේ මෙම ආධුනික පුහුණු පාඨමාලාව ආරම්භ විය. 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී විසින් මෙම ආධුනික පුහුණු පාඨමාලාවේ ආරම්භක දේශණය සිදුකළ අතර, 521, 522 සහ 523 යන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු, විඩත්තපලෙයි බළඇණි පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් මෙම අවස්ථාවට සහභාගි වූහ.

# ඉගෙනුමට අත්වැලක්...

72 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම සේනාංක බලප්‍රදේශයේ තෝරාගත් දිළිඳු පවුල්වල පාසල් ළමුන් සඳහා රුපියල් 400,000.00 ක වටිනාකමකින් යුත් ඇපල් වර්ගයේ ටැබ් පරිගණක යන්ත්‍ර 11 ක් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණ. ඉකුත් ඔක්තෝබර් 10 වන දින එහි සේනාංකාධිපතිගේ ප්‍රධානත්වයෙන් සිදුකළ මෙම මාහැඟි කටයුත්තට ඔස්ට්‍රේලියාවේ පදිංචි ජයන්ත ජයරත්න මහතා මූල්‍ය දායකත්වය සපයන ලදී.



# මාහැඟි පරිත්‍යාගයක්...

කොවිඩ් 19 වෛරසය ආසාදිතව දැඩි සත්කාර ඒකකයන්හි ප්‍රතිකාර ලබන රෝගීන්ගේ හා අනෙකුත් රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා ඇමෙරිකානු ශ්‍රී ලංකා සංසදය විසින් යුද්ධ හමුදාව වෙත *"Oxygen Concentrators"* යන්ත්‍රයක් පරිත්‍යාග කරන ලදී. අදාළ යන්ත්‍රය ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මෙන්ම යාපනය දිස්ත්‍රික් කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීමේ සම්බන්ධීකරණ නිලධාරී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත 4 වන වෛද්‍ය බලකායේ අණදෙන නිලධාරී මේජර් ඒඒඑස්එස් කුමාර ආර්එස්පී යූඑස්පී විසින් යාපනය තෙලිප්පලෙයි මූලික රෝහල වෙත ඉකුත් ඔක්තෝබර් 05 වන දින භාර දෙන ලදී



# සඳගිරුසෑයේ චූඩා මාණික්‍යය වන්දනාමානයට...

සඳගිරුසෑය ස්තූපයේ පැළඳ වීමට නියමිත කොත් වහන්සේ සහ චූඩා මාණික්‍යය 12 වන පාබල සේනාංක මූලස්ථානයට අයත් හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මහජනතාවට ප්‍රදර්ශනය කිරීම ඉකුත් ඔක්තෝබර් 04 වන දින සිට ඔක්තෝබර් 07 වන දින දක්වා සිදු කෙරිණ. එම පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ උපදෙස් මත 122 වන පාබල බලසේනාව යටතේ ඇති 23 වන ගජබා රෙජිමේන්තුව සහ 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භට පිරිස් විසින් එය ඉතා සාර්ථක අන්දමින් සංවිධානය කළහ.



# අධ්‍යාපනයට අත්වැලක්...

72 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව 522 වන පාබල බලසේනාව සහ 15 (සේවා) ගජබා රෙජිමේන්තුව විසින් පුත්තූර් (නැගෙනහිර) ගම්මානයේ පදිංචි අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් මඩිහේ පඤ්ඤාසිංහ සිංහල හා හින්දු මිශ්‍ර පාසලේ ඉගෙනුම ලබන දූ දරුවන් 45 දෙනෙකු සඳහා පරිත්‍යාගශීලීන්ගේ අනුග්‍රහය මත පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 08 වන දින පවත් වන ලදී. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී වූ අතර 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 522 වන පාබල බලසේනාධිපති ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් ද ඊට එක්වූහ.



# දිළිඳු පවුල් වෙත සහන...



ආරුගම්බේ බේවිස්ටා හෝටලයේ අධිපති ගැමුණු පෙරේරා මහතාගේ ධන පරිත්‍යාගයෙන් 23 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු බලප්‍රදේශයට අයත් පානම පොතුවිල් පදිංචි දරිද්‍රතාවයෙන් පෙළෙන දිළිඳු පවුල් 50 ක් සඳහා රුපියල් 2550.00 ක වටිනාකමකින් යුත් වියළි සළාක මළු 50 ක් බෙදා දෙන ලදී. ඉකුත් සැප්තැම්බර් 22 වන දින සිදුකළ මෙම කටයුත්තට 23 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසු නිලයින් සහභාගී වූහ.

# අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාගයක්...

ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) සම්බන්ධීකරණයෙන් යාපනය ක්‍රිස්තියානි දේවස්ථානයේ ගරු එඩ්වඩ් පියතුමා විසින් වව්නියාව අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබන අයවලුන් හට අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පාර්සල් 100 ක් පසුගිය සැප්තැම්බර් 10 වන දින ප්‍රදානය කරන ලදී.



# නිවාස පරිත්‍යාගයක්...



56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූයූකේඑල්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ මඟපෙන්වීම මත 561 වන පාබල බලසේනාවේ අධීක්ෂණයෙන් ඉදිකරන ලද නව නිවසක් 72 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව 2021 ඔක්තෝබර් මස 03 වන දින විඥාණකුලම් කනගරායන්කුලම්හි පදිංචි වැන්දඹු මවක් වන සංජීවන් කුමුදුණී මහත්මිය වෙත භාරදෙන ලදි. නිවස ඉදිකිරීම සඳහා මූල්‍යමය දායකත්වය ඕස්ට්‍රේලියාවේ පදිංචි ශ්‍රී ලාංකික දානපතිනියක් වන සුජීවා දසනායක මහත්මිය විසින් ලබාදුන් අතර ඇයගේ ඥාතීන් ද නිවස භාරදීමේ අවස්ථාවට එක්වූහ. 16 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ පූර්ණ ශ්‍රම දායකත්වය මත මෙම නිවස ඉදිකිරීමේ කටයුතු මේජර් ජෙනරාල් ඒ ඒ ඩී එන් එස් දුණුවිල (විශ්‍රාමික) සහ අජිත් පී රඹුක්කන මහතා විසින් සම්බන්ධීකරණය කරන ලදී.

# මුල්ගල් තැබීමක්...



වව්නියාව, 218 ඩී ශ්‍රාස්තකුලම් ග්‍රාමසේවා වසමේ අඩු ආදායම් ලාභී පවුලක් වන ගෝවින්ද ශාන්ත වඩිවේල් යන අය වෙත නවතමයෙන් ඉදිකිරීමට යෝජිත නිවසක් සඳහා ඉකුත් සැප්තැම්බර් 24 වන දින මුල්ගල තැබිණ. 562 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්එස් ප්‍රේමවංශ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සම්බන්ධීකරණය සහ අධීක්‍ෂණය යටතේ ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ මධ්‍යස්ථානාධිකාරී පූජ්‍ය උඩුදුම්බර සෝභිත හිමිගේ මූල්‍යමය දායකත්වය මත මෙම නිවස ඉදි කෙරේ. ඊට 15 (සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් විසින් ශ්‍රමදායකත්වය ලබා දෙනු ලබති.

# වැඩිදියුණු වූ සෙබළ පහසුකම්...



4 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසු නිලයින්ගේද එම රෙජිමේන්තු මධ්‍යස්ථානයට අයත් සෙසු ක්‍රීඩා සහ සරඹ කණ්ඩායම්වල රාජකාරී නියුතු සෙනින් ගේද ප්‍රධාන අවශ්‍යතාවයක්ව පැවති පානීය ජලය ලබාගැනීම සඳහා වූ ජල පිරිපහදු යන්ත්‍රයක් පසුගියදා ස්ථාපිත කෙරිණ. ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ ක්‍රීඩා කණ්ඩායම භාර නිලධාරී ලුතිනන් කර්නල් එස්එම්යූ බංඩාර ජාශිබ ගේ පූර්ණ සම්බන්ධීකරණය මත ගල්හේනගේ අචල උදාන පෙරේරා මහතාගේ පුද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉතා කෙටි කාලයක් තුළ අභිනවයෙන් ඉදිකර මෙම ජල පිරිපහදු යන්ත්‍රය ඉකුත් ඔක්තෝබර් 01 වන දින එම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එස්එම්පී බංඩාර ශ්‍රීලංජාආබමු ගේ සුරතින් විවෘත කෙරිණ.





# කාර්යාල ක්‍රම හා පටිපාටි...

පසුගිය කලාපය හා සබැඳේ...

**ලිපිගොනු පවත්වාගෙන යන ක්‍රම**

## ලිපිගොනුවක් අලුතින් ආරම්භ කරන ආකාරය

- ප්‍රතිපත්තියක් වශයෙන් අවුරුද්දක් ආරම්භයේදී එක් එක් විෂයට නව ලිපිගොනු ආරම්භ කළ යුතුය. එමෙන්ම අවශ්‍ය විෂයන් සඳහා ප්‍රතිපත්ති ගොනු ආරම්භ කළ යුතුය. එසේ ආරම්භ කරනු ලබන ලිපි ගොනු තුළ ගොනු කළ යුත්තේ උපරිම වශයෙන් ලිපි 200 ත්, 250 ත් අතර සංඛ්‍යාවකි. ලිපි ගොනුවක් ආරම්භ කිරීමේදී ලිපිගොනුවේ ඉහළ දකුණු කෙලවරේ ගොනු අංකය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුයි. විෂය ගොනුවේ මැදට වන්නටද, ඊට පහළින් විෂය භාර ලිපිකරුගේ නම, ගොනුව ආරම්භ කළ දිනය (අවසන් කළ පසු) සඳහන් කර තැබිය යුතුයි.

- ලිපි ගොනු කිරීමේදී සෑම ලිපියක්ම නියමිත ගොනුවේ ක්‍රමාණුකූලව ගොනු කළ යුතු අතර, එම සියලු ලිපි, පත් ඉරු අංක යොදා වම් පස ඇති කෙටි සාරාංශ පත්‍රයේ සටහන් තැබිය යුතුය. ලිපිගොනුවක් බලධාරීන් වෙත ඉදිරිපත් කරන අවස්ථාවේ දී සාරාංශ පත්‍රයේ විස්තර සටහන් කර ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව බලධාරීන් විසින් දෙනු ලබන උපදෙස්ද, සාරාංශ පත්‍රයේ සටහන් කරනු ලබයි. විෂය භාර ලිපිකරුවන් විසින් පිළිතුරු ලිපි සකස් කළ යුත්තේ එම උපදෙස් වලට අනුකූලවය. මෙමගින් සියලු අයවලුන්ගේ රාජකාරීමය ආරක්ෂාව තහවුරු වන අතර, සාරාංශ පත්‍රය ගොනුවේ පටුන ලෙසද භාවිතා කිරීමට හැකිය.

- ලිපි ගොනුකළ පසු එම ලිපියට අදාළ සියලුම සම්බන්ධිත ලිපි වල අංක පහත සඳහන් අයුරු එහි සටහන් කළ යුතු වේ. ගොනු කරනු ලබන ලිපියේ පහළ ඉඩ ඇති ස්ථානයක ඉංග්‍රීසි "T" අක්ෂර හැඩය යොදා එම ලිපියට පෙර ගොනු කර ඇති සියලුම සම්බන්ධිත ලිපි වල අංක "T" අක්ෂරයේ දකුණු පසින්ද පසුව ගොනු කර ඇති ලිපි වල අංක "T" අක්ෂරයේ වම් පසින්ද පැහැදිලිව සඳහන් කර තැබිය යුතුයි.

උදාහරණ :-

| | | | |
|---|---|---|---|
| ගොනුවේ මෙම ලිපියට සම්බන්ධ උඩින් ගොනුකර ඇති ලිපි අංක | 13<br>15<br>20 | 10<br>08<br>05<br>02 | ගොනුවේ මෙම ලිපියට සම්බන්ධ යටින් ගොනුකර ඇති ලිපි අංක |

## පොත් ගොනු ක්‍රමය:

මෙය ඒකාබද්ධ ගොනු ක්‍රමය වශයෙන් හඳුන්වනු ලබයි. මෙම ක්‍රමය භාවිතා කරන විට, කවරේ දකුණු පැත්තේ ලියකියවිලි ඇමිණීම කරනු ඇත. ලියුම් සහ සටහන් අතර පරණම ලියවිල්ල මුදුනෙහි ද අලුත්ම ලියවිල්ල අඩියෙහි ද තිබෙන ආකාරයට තබමින් කාල ක්‍රමානුකූලව වමේ සිට දකුණට අමුණනු ලබන මෙය පොතක් බලන ආකාරයට කියවිය හැකිය.

- මෙම ක්‍රමයට ලිපිගොනු තබා ගැනීමේදී වාසි කිහිපයකි.

විෂය පිළිබඳව කතාන්දරය පියවරෙන් පියවර පොතක් මෙන් දිග හැරීම ප්‍රධාන වේ.

මෙම ගොනුව සමග ඉදිරිපත් කරන සටහන තීරණයක් සඳහා වූ හැම ප්‍රශ්නයකටම කෙටියෙන් දැක්වුණු සටහනකි.

මේ නිසා නියෝග දීමේදී මාණ්ඩලික නිලධාරියාට පහසු වන අතර, පිළිතුරු සැපයීමේදී ලිපිකරුට ද පහසුවක් වේ.

ආණ්ඩුවේ සාමාන්‍ය කටයුතු වලදී මෙම ක්‍රමය වඩා වාසිදායකය. තවද විශාල ගොනු වශයෙන් තබා ගැනීමට පුළුවන.

- මෙසේ ලිපිගොනු තබා ගැනීමෙන් මුහුණු දීමට සිදුවන අවාසි කිහිපයකි.

සටහන් හා ලිපි මිශ්‍රව තිබීම නිසා ක්‍රියා අනු පිළිවෙල බලා ගැනීම අපහසුවීම හා වෙහෙස ගෙන දෙන්නා වූ ක්‍රියාවලියක් වීම

මෙම ලිපිගොනු වෙනත් දෙපාර්තමේන්තුවකට යැවීමේදී හෙළි නොකළ යුතු කරුණු ඇතුළත් සටහන් වෙතොත් ඒවා ඉවත් කර ගැනීමට අපහසු වේ.

විෂය පිළිබඳ නවක ලිපිකරුවෙකුට පහසුවෙන් පරිශීලනය කිරීමේදී අපහසුකම් ඇති වේ.

ලියවිල්ලක් ගොනුවෙන් ඉවතට ගිය විටෙක එහි කුමක් සිදුවීද යන්න දැනගැනීමට අපහසු වන අතර, ලියවිල්ලක් පිටතට යැවීමේදී ඒ පිළිබඳව යොමු සටහනක් නොමැතිවීම තවත් එක් අවාසියකි.

## විභාජිත ගොනු ක්‍රමය :

විභාජිත ක්‍රමයට අමතරව, බෙදූ ලිපිගොනු ක්‍රමය, දෙබෑ ලිපිගොනු ක්‍රමය යනුවෙන්ද මෙය හඳුන්වනු ලැබේ. පොත් ලිපිගොනු ක්‍රමය හා සසඳන විට මෙහි විශේෂිත ලක්ෂණයක් වන්නේ ලිපිගොනුවේ වම් සහ දකුණ යන දෙපැත්තට සටහන් හා ලියකියවිලි ගොනු කිරීම සඳහා ප්‍රයෝජනයට ගැනීමයි. ඒ අනුව මෙම ක්‍රමය යටතේ ලිපිගොනු කවරයේ වම්පස පළුවේ සටහන් පත්‍රිකා ද දකුණු පස පළුවේ ලියකියවිලි ද ගොනු කරනු ලැබේ. මෙම ක්‍රමය යටතේ ලිපිගොනු පවත්වා ගැනීමේදී සටහන් තබනු ලබන්නේ සටහන් පත්‍රිකා වල පමණකි. ඒ අනුව ලිපිවල සටහන් ලිවීමක් සිදු නොවේ.

විශේෂයෙන් රජයේ කාර්යාල වල පෞද්ගලික ලිපිගොනු සඳහා පොත් ලිපිගොනු ක්‍රමයක් ද, එදිනෙදා භාවිතා කරන කාරණා ගොනු සඳහා බොහෝ විට විභාජිත ගොනු ක්‍රමයක්ද භාවිතා කරනු ලැබේ. සටහන් පත්‍ර රෝම ඉලක්කමෙන්ද ලියකියවිලි අරාබි ඉලක්කමෙන්ද අංක කිරීම පිළිගත් සම්ප්‍රදායයි. ලියවිල්ලක් ගොනුවෙන් පිටතට යවන විට ඒ පිළිබඳව සටහනක් සටහන් පත්‍රවල තබනු ලැබේ. පොත් ලිපිගොනු ක්‍රමය සමග සසඳන විට විභාජිත ලිපිගොනු ක්‍රමයේ පහත දැක්වෙන වාසි දැකිය හැක.

- ලියකියවිලි නොකියවා සටහන පමණක් පරීක්ෂා කිරීමෙන් ක්‍රියා පිළිවෙල, විෂයෙහි ප්‍රගතිය හා ඉතිහාසය පරීක්ෂාකර බැලීමට පුළුවන.
- ලිපිගොනුව වෙනත් අංශයකට හෝ බාහිර ආයතනයකට යවන විට හෙළිදරව් නොකළ යුතු කරුණු අඩංගු සටහන් පත්‍රය ගලවා ඉතිරි සටහන් පත්‍ර සමග ලිපිගොනු යැවීමට හැකි වේ.
- සටහන් පත්‍රය සැබවින්ම ලිපිගොනුවේ සාරාංශයක් වන බැවින්, සටහන් පත්‍රය කියවීමෙන් එම විෂය පිළිබඳ තත්වය පහසුවෙන් වටහා ගැනීමට හා නිගමනවලට බැසීමට පහසුය.
- ලිපිගොනුවෙන් යම් ලියවිල්ලක් ඉවත් කළ විට ඒ පිළිබඳව සටහනක් සටහන් පත්‍රයේ තැබීමට පුළුවන.
- නවකෙකුට පහසුවෙන් පරිශීලනය කිරීමට පහසු වේ.

### මෙම ක්‍රමයේ අවාසිදායක තත්වයන් ද නැත්තේ නොවේ.

- විභාජිත ලිපිගොනු ක්‍රමය සඳහා වැයවන ලිපිකරු ශ්‍රමය ඉතා වැඩිය.
- සටහන් පත්‍ර ලිපි නාමාවලියක ස්වරූපය ගනී. සාමාන්‍ය කටයුතු වලදී අත්‍යාවශ්‍ය වන අන්දමේ අමතර වැඩ කොටසක් මේ ගොනු ක්‍රමයේදී කළ යුතුව ඇත.
- සටහන් පත්‍රයේ දැක්වෙන්නේ සිදුවීම් පිළිබඳව කෙටි සාරාංශයකි. මේ නිසා නිගමන ගැනීමේදීත් පිළිතුරු සකස් කිරීමේදීත් නිතර ලිපිවලට යොමුවීම අවශ්‍ය වේ.
- සටහන් පත්‍ර ගැලවී ගියහොත් ගනු ලැබූ ක්‍රියා මාර්ගයන්, නියෝග හා නියෝග දෙනු ලැබුයේ කවුද යන්න ගැන කිසිවක් අනාවරණය කරගැනීම අපහසුය.

## ලිපිකරුවෙකුගේ කාර්යභාරය

ලිපිකරුවාගේ කාර්යභාරය ලියකියවිලි තබාගන්නා පුද්ගලයෙකුගේ සිට තීරණ ගැනීම සඳහා කළමනාකරණ තොරතුරු සපයන්නෙකුගේ තත්වයට වෙනස් වී ඇත. වෙනස් වන පරිසරය තුළ ලිපිකරුවාට තම වැඩ කිරීමට භාවිතා කරන ක්‍රම ආකල්ප වෙනස් කරගැනීමට සිදුවී ඇත. එම නිසා වත්මන් ලිපිකරුවාටද තම උත්සාහයෙන් උපරිම ප්‍රතිඵලයක් ලබාගැනීමට නම් පහත දැක්වෙන කළමනාකරණ ක්‍රියාවලිය ගැන පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය.

- **සැලසුම් කිරීම**

තමන්ගේ රාජකාරී ලැයිස්තුව අනුව පැවරී ඇති රාජකාරීවල ප්‍රමුඛතාවය අනුව හඳුනා ගැනීම හා ඒවා ඉලක්ක නියම කරගෙන වැඩ සැලැස්මක් සකස්කර ගැනීම ලිපිකරුවාගේ සැලසුම්කරණ කාර්යය වේ.

- **සංවිධානය කර ගැනීම**

තමන්ගෙන් බලාපොරොත්තු වන නිමැවුම උපරිම අන්දමින් ලබාදීමට හැකිවන පරිදි අදාළ ඉලක්ක ඉටුකර ගැනීම සඳහා තම කාලය නැත්නම් වේලාව ක්‍රමානුකූලව සංවිධානය කරගැනීම.

- ලිපිකරුවෙකුගේ මට්ටමේදී මෙහෙයවීම යන්නෙන් අදහස් වන්නේ ඉතාම ක්‍රමානුකූලව තමන් විසින් සකස් කරගත් වැඩ සැලසුම් අනුව කාලය සැලසුම් කරගෙන ක්‍රමානුකූලව තමාට පවරා ඇති රාජකාරී කටයුතු නොපමාව කල් නොදමා ඉටු කිරීමයි.

- **පාලනය**

තමන් සතු වැඩ කොටස් සැලසුම් කරගෙන තිබේ නම් දිනපතා තමා බලාපොරොත්තු වූ ඉලක්ක ඉටුවී තිබේද යන්න විමසා බැලීම මෙයින් අදහස් වේ. මෙයින් කෙරෙන්නේ තමා ඉටුකරගැනීමට බලාපොරොත්තු වූ ඉලක්ක සහ සත්‍ය වශයෙන් කළ වැඩ කොටස් සංසන්දනය කර ඒ අතර යම් වෙනසක් ඇත්නම් විචලනයක් හෝ පිට පැනීමක් තිබේනම් සළකා බැලීමයි.

ලිපිකරුවෙකු සහ මාණ්ඩලික නිලධාරියෙකු උක්ත කළමනාකරණ ක්‍රියාවලිය භාවිතා කළේ නම් ඉතාමත් කාර්යක්ෂමව සහ ඵලදායීව පහසුවෙන් තම ඉලක්ක ඉටුකර ගැනීමට හැකි වනු ඇත. මෙසේ කටයුතු කිරීමෙන් මනා සේවයක් සමස්ත යුද හමුදාවේ සියලුම අයවලුන් හට ලබාදීමට හැකිවන බව මාගේ හැඟීමයි.

**ඉදිරිපත් කිරීම..**

***මේජර් විගලා පද්මකුමාර ශ්‍රීලයුපොදුසේබ***

# කර්නල් සේනාවිධායකට බුහුමන්...



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ 20 වන කර්නල් සේනාවිධායක ලෙස ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පසුගිය ඔක්තෝබර් 18 වන දින රාජකාරී භාරගන්නා ලදී. එහිදී එතුමන් වෙත එම රෙජිමේන්තු හට පිරිස් වෙතින් හිමිවූයේ ගෞරවනීය පිළිගැනීමකි.

# වෙරළ පවිත්‍රතාවයට මුල්වෙමින්...



ඉකුත් ඔක්තෝබර් 10 වන දිනට යෙදුණු යුද්ධ හමුදා දිනයට සමගාමීව 12 වන ශ්‍රී ලංකා පාබල හමුදාව, 24 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 19 වන ගැමුණු හේවා බලඇණිය සහ 5 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස් එකතුව වඩ්ඩුවාකල් සිට කෝකිලායි දක්වා මුහුදු වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් සිදු කළහ. 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබණ්ඩාර යූඑස්පී ගේ අදහසකට අනුව 593 වන පාබල බලසේනාධිපති කර්නල් එච්ටීඩබ්ලිව් විද්‍යානන්ද ගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ එය සිදුකෙරිණ.

# ලේ දන්දීමේ වැඩසටහනක්...





72 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව 57 වන පාබල සේනාංකයේ 100 ක හටපිරිසකගේ සහභාගීත්වයෙන් ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 10 වන දින යුද්ධ හමුදා රෝහල කිලිනොච්චිහි පැවැත්විණ. කිලිනොච්චි රෝහලේ අධ්‍යක්ෂ විසින් කළ ඉල්ලීමකට අනුව ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපතිගේ උපදෙස් පරිදි මෙම වැඩසටහන සිදුකරන ලදී.

# පානීය ජල පහසුකම් ලබාදෙමින්...



13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ හටපිරිස් හි ශ්‍රම දායකත්වයෙන් සහ යුද්ධ හමුදාවේ ප්‍රතිපාදන මගින් අංක 63 තඩ්ඩියාමලෛයි ග්‍රාම සේවා වසමේ තඩ්ඩියාමලෛයි ගම්මානයේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ජල පිරිපහදු යන්ත්‍රයක් විවෘත කිරීම ඉකුත් ඔක්තෝබර් 12 වන දින සිදුකරන ලදී. ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එස්පීකේජ් පිලපිටිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් මෙම ජල පිරිපහදු යන්ත්‍රය විවෘත කළ අවස්ථාවට 64 වන පාබල සේනාංකාධිපති, 643 වන පාබල බලසේනාධිපති සහ 13 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# යුද්ධ හමුදා දිනය වෙනුවෙන් වැඩසටහනක්...





ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ස්ථාපිත කර ඉකුත් ඔක්තෝබර් 10 වන දිනට වසර 72 ක් සපිරීම නිමිත්තෙන් හකාස අණසක මූලස්ථානය - කොස්ගම විසින් එම ප්‍රදේශයේ පිහිටා ඇති සාලාව රජයේ ප්‍රාදේශීය රෝහලේ ශ්‍රමදාන කටයුත්තක් සිදුකරන ලදී. හකාස අණසක ආඥාපති ගේ අදහසකට අනුව දියත් කළ එම ප්‍රජාසත්කාරයට එහි සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගි වූහ.




# යුද සිනමාවක් බිහිකිරීමට මේ හොඳම කාලයයි...

**"යුද්ධ හමුදාවේ චිත්ත ධෛර්යය වර්ධනය වන අන්දමේ සිනමා නිර්මාණ බිහි කිරීමට ඉදිරියේදී මා බලාපොරොත්තු වෙනවා"**

**- ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ චන්ද්‍රන් රත්නම්**

"ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂක වරයෙකු වන චන්ද්‍රන් රත්නම් සිනමාවට අත් පොත් තැබුවේ ලොව ප්‍රකට සිනමා කරුවකු වන ඩේවිඩ් ලීන් 1956 වසරේදී අධ්‍යක්ෂණය කළ "බ්‍රිජ් ඔන් ද රිවර් ක්වායි" (Bridge on the River Kwai) චිත්‍රපටයත් සමගිනි. සම්පූර්ණ වශයෙන්ම ශ්‍රී ලංකාවේ දර්ශනීය පසුතල යොදා ගනිමින් රූගත කළ මෙම චිත්‍රපටිය වෙනුවෙන් ඉමහත් කාර්යභාරයක් සිදු කළ හෙතෙම ඉන් අනතුරුව ඇමරිකා එක්සත් ජනපදයට ගොස් ජාත්‍යන්තර සිනමා කර්මාන්තයේ ද නිරත විය. ඔහු "ඒෂියන් ෆිල්ම් ලොකේෂන් සර්විසස්" පුද්ගලික සමාගමේ (Asian film location services Pvt Ltd) වත්මන් සභාපතිවරයා මෙන්ම ලයන් එයාර් ගුවන් සමාගමේ (Lion Air Ways) හිටපු සභාපතිවරයාද වේ. එමෙන්ම රත්මලාන පිහිටි "ඒෂියන් ඒවියේෂන් සෙන්ටර්" (Asian Aviation Centre) නමැති පුද්ගලික ගුවන් යානා පුහුණු පාසලේ සභාපතිවරයා වන්නේද චන්ද්‍රන් රත්නම්ය. වරෙක සිය සිනමා නිර්මාණයක් වූ "ඉන්දියානා ජෝන්ස් ඇන්ඩ් ද ටෙම්පල් ඔෆ් ද ඩූම් (Indiana Jones and the Temple of the Doom) චිත්‍රපටයේ රූගත කිරීමක් වෙනුවෙන් එකල ශ්‍රී ලංකාවට පැමිණි ලොව ප්‍රකට සිනමාකරුවෙකු වන ස්ටීවන් ස්පිල්බර්ග් ඔහු හඳුන්වනු ලැබුවේ "අග්නිදිග ආසියාවේ සිටින අපගේ වටිනාම මිතුරා" (Our most valued friend in the far East) යන විරුදාවලිය ඔහු වෙත ලබා දෙමිනි. එමෙන්ම චන්ද්‍රන් රත්නම් ශ්‍රී ලංකාවේ රූගත කරන ලද හොලිවුඩ් චිත්‍රපට ද ඇතුළු විදේශීය චිත්‍රපට ගණනාවක් වෙනුවෙන් අවශ්‍ය කැමරා උපකරණ ඇතුළු දර්ශන තල හා වෙනත් සේවාවන් සැපයුම් කටයුතු වෙනුවෙන් පුළුල් මෙහෙවරක නිරතව ඇත. වරෙක යුද හමුදා කපිතාන්වරයෙකු පිළිබඳ කතා පුවතක් තේමා කර ගනිමින් ඔහු විසින් අධ්‍යක්ෂණය කරන ලද "අලිමංකඩ" (The Road From the Elephant Pass) චිත්‍රපටය 2011 වසරේ දී ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් හි පැවැති ජාත්‍යන්තර රූපවාහිනී හා චිත්‍රපට සම්මාන උළෙලේ දී (New York International Television and Film Festival) සම්මානයට ද පාත්‍ර විය .මෙය ට පසු අවස්ථාවක ඔහු විසින් අධ්‍යක්ෂණය කළ කොමන් මෑන් (Common Man) චිත්‍රපටය මැඩ්රිඩ් සිනමා සම්මාන උළෙලේ

හොඳම චිත්‍රපටය, හොඳම සිනමා අධ්‍යක්ෂකවරයා මෙන් ම හොඳම නළුවා යන සම්මාන ත්‍රිත්වයම දිනා ගෙන තිබිණි. වර්ෂ 1956 දී, එනම් එවකට 16 හැවිරිදි කොළු ගැටයෙකු වශයෙන් සිනමා ක්ෂේත්‍රයට අවතීර්ණ වූ ඔහු පිළිබඳ ව මෙන් ම ලොව ප්‍රකට බ්‍රිජ් ඔන් ද රිවර් ක්වායි (Bridge on the River Kwai) චිත්‍රපටය පිළිබඳව මෙතෙක් නොඇසූ හා අප්‍රකට පුවත් ඒ සම්බන්ධයෙන් පාඨක ඔබ දැනුවත් කිරීම මූලික අරමුණු කර ගනිමින් ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂක චන්ද්‍රන් රත්නම් මහතා සමගින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවක් ඇසුරින් මෙම ලිපිය සැකසේ.

**ප්‍රශ්නය :- බ්‍රිජ් ඔන් ද රිවර් ක්වායි චිත්‍රපටය හා ඔබ සම්බන්ධ වූයේ කෙසේ ද?**

පිළිතුර :- ඇත්තෙන් ම එය සිදු වූයේ 1956 වසරේ මුල් අවධිය තුළය. ලංකාවේ සංචාරක කර්මාන්තයේ පුරෝගාමියෙකු වන දොන් ලියනගේ (Don Liyanage) මහතා එවකට කොළඹ කුරුඳු වත්ත ප්‍රදේශයේ පිහිටි අප නිවසට, කඩවසම් අයුරින් හැඳ පැළඳ සිටි විදේශිකයෙකු සමගින් පැමිණ සිටියා. එමෙන්ම ඔවුන් පැමිණ සිටියේ අප ගේ නිවසට යාබද ඇනෙක්සිය හය මසක කාල සීමාවක් සඳහා කුලියට ගැනීමට හැකියාවක් ඇත්දැයි යන්න සොයා බැලීමටයි. එනමුත් මගේ මව ඔවුන්ට එම ඇනෙක්සිය හය මසක කාලසීමාවක් වෙනුවෙන් ලබා දීමට ඒ තරම් කැමැත්තක් දැක්වූයේ නැහැ. කෙසේ නමුත් ඔවුන් සමගින් වැඩිදුරටත් කතා බහ කිරීමේ දී එම විදේශිකයා ලොව සුපතල හොලිවුඩ් චිත්‍රපටි සමාගම් හා සම්බන්ධ සිනමා නිර්මාණ වලට සම්බන්ධ පුද්ගලයෙකු බවට මට අවබෝධ වුණා. එබැවින් මවගේ අකමැත්ත පසෙක තබා, එම විදේශිකයාට අපගේ ඇනෙක්සිය කුලියට ලබා දීම වෙනුවෙන් මගේ මවගේ කැමැත්ත ලබා ගැනීමට මට හැකි වුණේ ඉතාමත් දෛවෝපගත අයුරිනි.

එම විදේශිකයාගේ නම එඩී ෆ්වුලී (Eddie Fowlie) බව මා පසුව දැන ගත්තා. ඔහු අපගේ ඇනෙක්සියට පැමිණියේ ඔහුගේ රූමත් පෙම්වතිය වන ඩොරිස් (Doris ) සමගින්ය. එමෙන් ම ඔහු හා තව දුරටත් පිළිසඳරේ නිරත වීමේ දී දෙවන ලෝක යුද්ධය හා සම්බන්ධ කතා පුවතක් ඇසුරින් නිර්මාණය කිරීමට නියමිත සිනමා පටයක් වන "බ්‍රිජ් ඔන් ද රිවර් ක්වායි" නමැති චිත්‍රපටයේ කලා අධ්‍යක්ෂකවරයා ඔහු බව මට අවබෝධ වුණා. එම අවධියේ සිටම චිත්‍රපට සම්බන්ධයෙන් දැඩි උනන්දුවක් දැක්වූ මා අපගේ ඇනෙක්සිය ට අලුතින් පැමිණි එම විදේශීය යුවලගේ සෑම අවශ්‍යතාවයක්ම දැඩි ඕනෑකමකින් ඉටු කර දීමට සෑම විටම කටයුතු කළා. එමෙන්ම නිරන්තරයෙන්ම ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඒ සම්බන්ධව දැඩි කැපවීමකින් කටයුතු කළ මා පිළිබඳව දැඩි ප්‍රසාදයට පත් වූ ඔවුන් නොබෝ දිනක් යාමට මත්තෙන් මා සමගින් ඉතා කුළුපග වෙමින් දැඩි මිත්‍රත්වයක් ගොඩනගා ගත්තා. මේ හේතුව නිසාවෙන්ම ඉදිරියේ දී නිර්මාණය කිරීමට නියමිත එම හොලිවුඩ් චිත්‍රපටයේ කලා අධ්‍යක්ෂකවරයාගේ සහායකවරයෙකු වශයෙන් රැකියා අවස්ථාවක නිරත වීමට ද මට අවස්ථාව උදා වුණා. ඒ අනුව එදින සිට එම චිත්‍රපටයේ දර්ශන පසුතල සඳහා අවශ්‍ය වන සියලුම උපකරණ නිර්මාණය කිරීමට මා දායක වුණ අතර එම උපකරණ තැන්පත් කිරීම සඳහා පරණ බස් රථයක් සොයා දීමට ද මා කටයුතු කළා.


එමෙන්ම මෙම චිත්‍රපටය වෙනුවෙන් කිතුල්ගල ප්‍රදේශය ආශ්‍රිතව සිදු කරන රූගත කිරීමක් සඳහා සහභාගි වීමට ද මට අවස්ථාව උදා වුණා. එම චිත්‍රපටයේ ඇති පාලම නිර්මාණය වනුයේ කිතුල්ගල ආශ්‍රිතවයි. එමෙන් ම මට එම චිත්‍රපටයට අදාළව දෛනිකව ලබා දුන් වේතනයක් මත එහි වැඩ කටයුතු කිරීමට ඒ අවස්ථාව සැලසුණා. මුල්ම දිනයේ මට නවාතැන් සැපයුනේ පොල් අතු සෙවිලි කළ කුඩා පැල්පතකයි. එහි මට නිදා ගැනීමට පැදුරක් හා කොට්ටයක් ද තබා තිබුණා. මෙසේ ටික දිනක් ගත වෙද්දී චිත්‍රපටයේ නිෂ්පාදක කණ්ඩායම විසින් සතිපතා වේතන ලබන කණ්ඩායමට මාව ද ඇතුළත් කර ඇති බව දැනගැනීමට ලැබුනා .කෙසේ වුවත් එම අවධියේ දී චිත්‍රපට කර්මාන්තය පිළිබඳ කිසිදු අවබෝධයක් නොතිබූ මා එඩී ෆවුලී සහ ඔහුගේ සහායකයා වන ටොම් අර්ලි (Tom Early) ඇසුරින් චිත්‍රපට කර්මාන්තයට අදාළ ඒ බොහෝ දේ ඉගෙන ගත්තා. මේ අනුව "බ්‍රිජ් ඔන් ද රිවර් ක්වායි" චිත්‍රපටය රූ ගත කිරීම් ආරම්භ වූ 1956 වසරේ ඔක්තෝබර් මස සිට එහි රූගත කිරීම් නිමවුණු 1957 වසරේ මැයි මස දක්වා ම එම චිත්‍රපටයේ නිෂ්පාදක කණ්ඩායම හා එකතු වී එහි අවසන් අදියර දක්වාම මගේ දායකත්වය ඒ වෙනුවෙන් ලබා දුන්නා.

**ප්‍රශ්නය :- මෙම චිත්‍රපටයේ රූගත කිරීම් සිදු වන අතර දී සිදු වූ අමතක නොවන හා රසවත් සිදුවීම් පිළිබඳව යමක් සඳහන් කළහොත්?**

පිළිතුර :- ඇත්තෙන්ම මෙම චිත්‍රපටයේ



චිත්‍රපට අධ්‍යක්ෂ චන්ද්‍රන් රත්නම් ලොව ප්‍රකට සිනමාකරුවෙකු වන ස්ටීවන් ස්පිල්බර්ග් සමගින්..




රූ ගත කිරීම් ආරම්භ කළ දිනයේ සිටම ඒ හා බැඳුණු රසවත් සිදුවීම් ගණනාවක් තිබෙනවා. එමෙන්ම ඔබට මතක් කළ යුතු තවත් දෙයක් වන්නේ චිත්‍රපටියක් නිර්මාණය කිරීමේ දී ඊට අදාළ හැම සිදුවීමක්ම අප සැලසුම් කළ අයුරින්ම සිදුවීමේ හැකියාවක් නොමැති බවයි. මෙයට හොඳම නිදසුනක් වන්නේ මෙම චිත්‍රපටයේ ඇති පාලම පුපුරුවා හැරීමේ දර්ශනය අප කලින් සැලසුම් කළ පරිද්දෙන් සිදු නොවීමයි. ඇත්තෙන්ම එය සිදු වූයේ එම චිත්‍රපටය හා සම්බන්ධ වූ කැමරාකරුවෙකු අතින් සිදුවූ අත්වැරදීමක් හේතුවෙන්. පාලම පුපුරුවා හැරීමට අදාළ දර්ශනය රූගත කිරීමට සිනමා කැමරාකරුවන් කිහිප දෙනෙක් ම යොදවා සිටි අතර පාලම පුපුරන අවස්ථාවේදී එම කැමරාකරුවන් ගේ ජීවිතාරක්ෂාව වෙනුවෙන් ඔවුන්ට මුවා වීම සඳහා විශේෂ ස්ථානයන් සකස් කර තිබුණා. එමෙන්ම දුම්රිය අදාළ පාලම මතින් ගමන් කරද්දී එම පාලම පුපුරවා හැරීමට කටයුතු යොදා තිබූ අතර කැමරාකරුවන් තමන් ආරක්ෂිත ස්ථාන වල සිටින බවට සංඥා කරමින් ඔවුන් සිටි ආරක්ෂක ස්ථානයන්හි තිබූ කුඩා විදුලි බල්බයක් දැල්වීමට නියමිතව තිබුනා. එනමුත් එම දර්ශනය රූගත කරමින් සිටි සිනමා කැමරාකරුවන් පස් දෙනාගෙන් එක් අයෙකු තමන් ආරක්ෂිතව සිටින බවට සංඥා කරමින් අදාළ විදුලි බුබුල දැල්වූයේ නැහැ. මේ නිසාම එම දුම්රිය පාලම මතින් ගමන් කරද්දී එය පුපුරවා හැරීමට වෙඩි පිපිරවීම් දර්ශන භාරව සිටි කණ්ඩායම කටයුතු නොකළේ කැමරාකරුවන්ගේ ජීවිත ආරක්ෂාව සම්බන්ධයෙන් ඔවුන් වෙත වගකීමක් ඇති නිසයි. කෙසේ වුවත් පාලම මතින් දැඩි වේගයෙන් ගමන් කළ දුම්රිය එන්ජිම තවත් නිමේෂයක දී, එම රේල් පාර අවසන් වන ස්ථානයේ තිබූ විශාල ප්‍රමාණයේ ජෙනරේටරයක ගැටීමත් සමගින් උඩුකුරුව පෙරළී ගියා.

කෙසේ වුවත් ඊළඟ දිනයේ විශාල වියදමක් දරා දොඹකර ගෙන්වා ගෙන දුම්රිය යළි පීලි මත ස්ථානගත කරවා අදාළ දර්ශනය නිවැරදි අයුරින් රූ ගත කිරීමට හැකි වුණා. චිත්‍රපටය නැරඹීමේ දී ඔබට දැකගත හැකි වන්නේ දෙවන දිනය තුළ රූ ගත කරන ලද පාලම පුපුරවා හැරීමේ දර්ශනයයි .

**ප්‍රශ්නය :- බ්‍රිජ් ඔන් ද රිවර් ක්වායි චිත්‍රපටය මෙන් ම දෙවන ලෝක යුද්ධය හා සම්බන්ධ තිර පිටපත් ඇසුරින් ලොව බොහෝ රටවල සිනමාපට නිර්මාණය වූ බවක් අපට දැක ගැනීමට හැකි වුවත්, ශ්‍රී ලංකාවට අදාළව යුද්ධය මෙන් ම යුද හමුදාව සම්බන්ධ චිත්‍රපට නිර්මාණය වන්නේ ඉතා අතලොස්සක්, මේ තත්ත්වයට හේතුව කුමක්ද ?**

පිළිතුර :-
මේ සම්බන්ධයෙන් මට පැවසිය හැක්කේ යුද්ධය හා සම්බන්ධ ඉතාමත් රසවත් හා හැඟුම්බර සිදුවීම් රැසක් තිබුනත් ශ්‍රී ලාංකීය සිනමාකරුවන් බොහෝ දෙනෙක් ඒ පිළිබඳ එතරම් උනන්දුවක් නොදැක් වූ බවයි. ශ්‍රී ලංකාවේ පැවති යුද්ධය හෝ යුද හමුදාව සම්බන්ධයෙන් චිත්‍රපට නිර්මාණය කළ සිනමාකරුවන් බොහෝ පිරිසක් සැබවින්ම එම නිර්මාණ සිදුකළේ සත්‍ය තත්ත්වය යටපත් කරමින් රාජ්‍ය නොවන සංවිධාන වලින් ලැබුණු අති විශාල මුදල් කන්දරාවට ගිජුව බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැහැ. මූලික වශයෙන්ම ඔවුන් එම නිර්මාණයන් සිදු කළේ යුද හමුදාව අපකීර්තියට පත් වන අයුරින් බව ඉතාමත් පැහැදිලි වෙනවා. කෙසේ වෙතත් බූඩී කීර්තිසේන වැනි සිනමාකරුවන් යුද්ධය තේමා කරගත් ප්‍රශස්ත මට්ටමේ නිර්මාණ සිදු කිරීමට උත්සාහ කළා.

**ප්‍රශ්නය :- අද රටේ පවතින කොවිඩ් -19 තත්ත්වයත් සමගින් බොහෝ සිනමා ශාලාවන් ප්‍රමාණයක් වැසීයාමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙනවා. එමෙන්ම චිත්‍රපට නිෂ්පාදකවරුන් පවා, සිනමා නිර්මාණයක් වෙනුවෙන් මුදල් ආයෝජනය කිරීමට මැලිකමක් දක්වන්නේ එය පාඩු ලබන ව්‍යාපාරයක් බවට අදහස් පළ කරමිනුයි. මේ තත්ත්වය සම්බන්ධයෙන් ඔබ දරන මතය පිළිබඳ පැහැදිලි කළොත් ?**

පිළිතුර :- චිත්‍රපට නිෂ්පාදනය පාඩු ලබන ව්‍යාපාරයක් බවට පත් ව ඇත්තේ ශ්‍රී ලංකාවේ පමණයි. කොරෝනා ව්‍යසනයත් සමගින් යම් මට්ටමකට චිත්‍රපට කර්මාන්තය පාඩුවක් ලැබූ බව සත්‍යයක්, එනමුත් එය කිසි විටෙකත් ඔබ ඔබගේ පවුලේ අයවලුන් සමගින් හෝ ඔබගේ පෙම්වතිය හෝ පෙම්වතා සමගින් සිනමා පටයක් නැරඹීමට යාමේ සිහිනය කිසි විටෙකත් බොඳ කරගත යුතු නැහැ. මේ තත්ත්වය සම්බන්ධයෙන් මා දකින හොඳම විසඳුම විදේශීය චිත්‍රපට ආනයනය මෙන් ම සියලුම සිනමා ශාලාවන් පුද්ගලීකරණය කිරීමයි. එමෙන් ම දේශීය චිත්‍රපට නිෂ්පාදකවරුන් බටහිරින් මේ රටට ආනයනය කරන චිත්‍රපට හා තරගයක් ලබා දීමට හැකි මට්ටමේ නිෂ්පාදන එළි දැක්විය යුතුයි. චිත්‍රපට නිෂ්පාදනය යනු කර්මාන්තයක් බව අප විසින් අමතක කළ යුතු නැහැ. ඇත්තෙන් ම මෙරට චිත්‍රපට කර්මාන්තය සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පැවතියත් සැබැවින්ම එය පැවතිය යුතු ව ඇත්තේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ බව සඳහන් කළ යුතුයි.

**ප්‍රශ්නය :- සිනමා රංගනය සම්බන්ධයෙන් දක්ෂතා ඇති තරුණ තරුණියන්ට තමන්ගේ දක්ෂතා එළි දැක්වීම මෙන්ම**

**ඔවුන් ගේ රංගන කුසලතාවන් තවත් ඔප් නංවා ගැනීම සඳහා සුදුසු වෘත්තීය මට්ටමේ සිනමා පාසලක් තවමත් මේ රට තුළ ඉදි වී නැහැ නේද ?**

පිළිතුර :- ඔව්, සැබවින්ම එය ලැජ්ජාවට කරුණක්. කෙසේ නමුත් මෙයට වසර කීපයකට ප්‍රථමයෙන් දිගන ප්‍රදේශයේ දී මා සිනමා ක්ෂේත්‍රයට සම්බන්ධ තවත් පුද්ගලයන් හා එකතු වී සිනමාකරන වැඩමුළුවන් කිහිපයක්ම පවත්වනු ලැබුවා. නමුත් අවාසනාවකට මෙන් දිගින් දිගටම එම සිනමාකරන වැඩමුළු පවත්වා ගෙන යෑමට අපට ඉඩ ප්‍රස්ථාවන් උදා වූයේ නැහැ. කෙසේ නමුත් ඉදිරි කාල සීමාවන් තුළ කොළඹ ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් අංග සම්පූර්ණ සිනමා පාසලක් බිහිකිරීම වෙනුවෙන් මා කටයුතු සැලසුම් කර තිබෙනවා .

**ප්‍රශ්නය :- සම්මානනීය ගත්කරුවෙකු වන නිහාල් සිල්වා විසින් රචනා කරන ලද "රෝඩ් ෆ්‍රොම් ද එලිෆන්ට්පාස්"** (Road from the Elephant Pass) **ග්‍රන්ථය ඇසුරින් "අලිමංකඩ" නමින් යුද හමුදාවට අදාළ චිත්‍රපටියක් අධ්‍යක්ෂණය කිරීමට ඔබ විසින් කටයුතු කරනු ලැබුවා .එමෙන්ම මේ ආකාරයෙන්, ඉදිරි කාල සීමාව තුළ දී යුද හමුදාවට සම්බන්ධ තිර පිටපත් ඇසුරින් සිනමා පට නිර්මාණය කිරීමට ඔබ සැලසුම් කරනවාද ?**

පිළිතුර :- අලිමංකඩ චිත්‍රපටය යනු යුද්ධය හා හමුදාව පිළිබඳ ඉතාමත් මානුෂීය පුවතක් අන්තර් ගත වන සිනමා නිර්මාණයක්. මීට අදාළ Road from Elephant Pass නම් ග්‍රන්ථය අද ජීවතුන් අතර නොමැති ප්‍රකට ගත්කතුවරයෙකු වන නිහාල් ද සිල්වා මහතා විසින් ඉතා විශිෂ්ට අයුරින් රචනා කර තිබීම හේතුවෙන් ඒ ඇසුරෙන් සිනමා නිර්මාණයක් සිදු කිරීමට මා පෙළඹුනා . ඒ වගේම යුද්ධ හමුදාවට අදාළ එවන් විශිෂ්ට ගණයේ තවත් නිර්මාණ ඇත්නම් ඒ ඇසුරෙන් සිනමා නිර්මාණයන් සිදු කිරීමට මා පැකිලෙන්නේ නැහැ. ඒ වගේම මා මේ අවස්ථාවේ සිහිපත් කළ යුතු වන්නේ Road from the Elephant Pass කෘතිය ඇසුරෙන් මා විසින් නිර්මාණය කෙරූ "අලිමංකඩ" චිත්‍රපටියට අදාළව රූගත කරන ලද වෙඩි පිපිරවීම් සම්බන්ධ දර්ශනවලදී ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා යුද හමුදාවෙන් අති විශාල සහයෝගයක් ලැබුණු බවයි. ඒ සම්බන්ධව මගේ කෘතඥතාව යුද හමුදාපතිතුමන් ඇතුළු ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත මා පිරිනමනවා. එමෙන්ම යුද්ධ හමුදාව ට අදාළව රචනා වී ඇති කෘතීන් සම්බන්ධයෙන් මා මේ දිනවල අධ්‍යයනයක් සිදු කරමින් සිටිනවා. ඇත්තෙන්ම යුද්ධයෙන් අනතුරුව කොවිඩ් -19 සම්බන්ධව යුද හමුදාව මගින් සිදුකරන ලද එන්නත්කරණ වැඩසටහන් පිළිබඳව ද මගේ අවධානය යොමු වී තිබෙන අතර ඉදිරි කාල සීමාව තුළ ඒ සම්බන්ධයෙන් ද චිත්‍රපටයක් අධ්‍යක්ෂණය කිරීමට මා සැලසුම් කර සිටිනවා. මේ සම්බන්ධයෙන් යුද්ධ හමුදාපති තුමන්ව දැනුවත් කිරීමට ද මා අදහස් කරනවා.



සාකච්ඡා සටහන...

*ලුතිනන් දුමින්ද සෙනරත්*

ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

# රණවිරු ස්මාරකය ඒකක අයිතියට...

දශක 03 ක් පුරා පැවති කුරිරු ත්‍රස්තවාදය නිම කිරීම සඳහා රටදැය වෙනුවෙන් සටන් වැද මියගිය 5 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් වීරෝදාර රණවිරුවන් 83 දෙනෙකු සිහිපත් කිරීම වෙනුවෙන් ඉදිවූ රණවිරු ස්මාරකයක් පසුගියදා විවෘත කෙරිණ. ඒකක අණදෙන නිලධාරි මේජර් එම්වී ප්‍රනාන්දු ශ්‍රීලංජාආබමු ගේ අධීක්ෂණය යටතේ එහි සියලු නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් තන්තිරිමලෙහි පිහිටි ඒකක මුලස්ථාන කඳවුරු භූමියේ ඉදිකරන ලද මෙම රණවිරු ස්මාරකය ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙහි රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් ඉකුත් සැප්තැම්බර් මස 15 වන දින සුභ මොහොතින් සියලුදෙනාගේ පුෂ්පෝපහාරය පිණිස නිරාවරණය කරන ලදී.







**වෘත්තීය දිවියේ අනේකවිද කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට දිරිය, විරිය, රැකවරණය ලැබේවායි "රණවිරුවා" මෙසේ සුබ පැතුම් එක්කරයි.**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ලෙස
**මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**
**2021 ඔක්තෝබර් මස 05 දින සිට**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා 1 වන බලකායේ බලකාධිපති ලෙස
**මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී**
**2021 ඔක්තෝබර් මස 18 දින සිට**



උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවේ උපකරණ මාස්ටර් ජෙනරාල් ලෙස
**මේජර් ජෙනරාල් පීජේපී ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී**
**2021 ඔක්තෝබර් මස 01 දින සිට**



ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**
**2021 ඔක්තෝබර් මස 04 දින සිට**



ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2021 ඔක්තෝබර් මස 04 දින සිට**



අධ්‍යක්‍ෂ ජෙනරාල් පාබල හමුදා ශාඛාවේ අධ්‍යක්‍ෂ ජෙනරාල් පාබල හමුදා ලෙස
**මේජර් ජෙනරාල් පීඑම්එල් චන්ද්‍රසිරි ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**
**2021 ඔක්තෝබර් මස 05 දින සිට**



විධායක ජෙනරාල් ශාඛාවේ විධායක ජෙනරාල් ලෙස
**මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2021 ඔක්තෝබර් මස 29 දින සිට**



58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස
**බ්‍රිගේඩියර් එස්ආර්බී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී**
**2021 ඔක්තෝබර් මස 04 දින සිට**



66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස
**බ්‍රිගේඩියර් බීකේපීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී**
**2021 ඔක්තෝබර් මස 03 දින සිට**



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂ ලෙස
**බ්‍රිගේඩියර් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී**
**2021 ඔක්තෝබර් මස 21 දින සිට**



රණවිරු සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂ ලෙස
**බ්‍රිගේඩියර් එම් මායාදුන්න ආර්එස්පී යූඑස්පී**
**2021 ඔක්තෝබර් මස 04 දින සිට**



ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස
**බ්‍රිගේඩියර් එම්පීකේ මදුරප්පෙරුම ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**2021 ඔක්තෝබර් මස 07 දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බ්‍රිගේඩියර් ප්‍රමානි ලෙස
**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව්ඩබ්ලිව්එම්පීඩබ්ලිව්ඩබ්ලිව්බීආර් පාලමකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2021 ඔක්තෝබර් මස 05 දින සිට**



කුකුලේගඟ ශ්‍රී ලංකා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනයේ නව සේනාවිධායක ලෙස
**බ්‍රිගේඩියර්**
**සීජේ රාජපක්‍ෂ ආර්එස්පී**
**2021 ඔක්තෝබර් මස 27 දින සිට**



593 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස
**කර්නල්**
**එච්ටීඩබ්ලිව් විද්‍යානන්ද ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**2021 ඔක්තෝබර් මස 05 දින සිට**



653 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස
**කර්නල්**
**ඩීඑන්සී සේරසිංහ ආර්එස්පී යූඑස්පී**
**2021 සැප්තැම්බර් මස 27 දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) කර්නල් ප්‍රමානි ලෙස
**කර්නල්**
**කේඑම්සීඑස් කුමාරසිංහ**
**2021 සැප්තැම්බර් මස 24 දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ප්‍රමානි 1 (සම්) ලෙස
**ලුතිනන් කර්නල්**
**එච්පීජේටී පෙරේරා ආර්එස්පී**
**2021 ඔක්තෝබර් මස 06 දින සිට**



4 වන ශ්‍රී ලංකා කාලවක්කු හමුදාවේ අණදෙන නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල්**
**ආර්කේඑම්එස් කුලතුංග ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී**
**2021 සැප්තැම්බර් මස 30 දින සිට**



මාණ්ඩලික රාජකාරී අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ප්‍රමානි I ලෙස
**ලුතිනන් කර්නල්**
**පීඒඩී අල්විස් ආර්එස්පී පීඑස්සී**
**2021 ඔක්තෝබර් මස 22 දින සිට**



1 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**ඩබ්ලිව්සී සමරසිංහ ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**2021 ඔක්තෝබර් මස 05 දින සිට**



1 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**යූපීඑස් විජේනායක යූඑස්පී පීඑස්සී**
**2021 සැප්තැම්බර් මස 24 දින සිට**



24 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**එන්ටීසීඑස් නල්ලපෙරුම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**
**2021 ඔක්තෝබර් මස 01 දින සිට**



14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර්**
**එස්අයි ප්‍රසන්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**2021 ඔක්තෝබර් මස 25 දින සිට**



# සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක්...

කොවිඩ්-19 වෛරසය මෙරටින් තුරන් වේවායි යන අධිෂ්ඨානය පෙරදැරිව ආරක්‍ෂක සේනා (නැගෙනහිර) ආඥාපති විසින් ලබාදුන් උපදෙස් මත ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ටීඑම් අබේරත්න ආර්එස්පී එල්එස්සී ගේ සහයෝගය ඇතිව සියලුම ශ්‍රී ලාංකිකයින්ට ආශිර්වාද එක් කිරීමේ සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් සහ දානමය පිංකමක් හිඟුරක්ගොඩ ජයමග මහා පිරිවෙනේදී පසුගියදා පවත්වන ලදී. 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකායේ අණදෙන නිලධාරී ඇතුළු හටපිරිස් විසින් එය සංවිධානය කරනු ලැබූහ.



# රට ගොඩනැගීමට යුද හමුදා ඉංජිනේරු සහය...

අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව ග්‍රාමීය මාර්ග කිඃමීඃ 100,000 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාතර, ගාල්ල, කළුතර සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හි මාර්ග 12 ක සංවර්ධන කටයුතු ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු බළකාය වෙත පවරන ලදී. ඒ අනුව මාතර දිස්ත්‍රික්කයේ කොළවෙනිගම ලංකාගම මාර්ගයේ ආරම්භ කළ සංවර්ධන කටයුතු 2021 ජුලි 12 වන දින අවසන් කරන ලදී. මෙම මාර්ගය කිඃමීඃ 5.4 ක දුරකින් යුක්ත වන අතර, එහි පලල මීඃ 3.6 කි. මෙම දුර ප්‍රමාණය ඇතුළත බෝක්කු 55 ක ඉදිකිරීම් කටයුතුද ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව විසින් සිදුකරන ලදී. මෙම මාර්ගය ඉදිකිරීම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් රුඃ 218,471,406.24 ක මුදලක් ඇස්තමේන්තු කර තිබූ නමුත් ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුවේ කාර්යක්ෂම දායකත්වය මත රුඃ 110,017,456.49 ක මුදලකින් ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවිය. එබැවින් රුඃ 108,453,949.75 ක මුදල් ප්‍රමාණයක් වෙනත් සංවර්ධන කටයුතු සඳහා යෙදවීම පිණිස මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඉතිරිකරදීමට ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව සමත් විය.

තවද, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ ජාතික ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් මෙරට කෘෂි වාරි පද්ධතීන් 5000 ක් පිළිසකර කිරීමේ කටයුතුද වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලදී. ඒ යටතේ මහවැලි "එල්" කලාපයට අයත් සහන් වැව, හංසවිල වැව, කම්බිලි වැව, වෙහෙර වැව, ඇතා වැටුනු වැව, මොණර වැව, නෙළුම් වැව, නික වැව, නික වැව අමුණ, වැලි ඇල අමුණ ඇතුළු වැව් ප්‍රතිසංස්කරණ කටයුතුද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත පවරන ලදී.

මෙම වැව් ප්‍රතිසංස්කරණ කටයුතු 2021.07.01 වන දින ආරම්භ කොට, 2021.09.25 වන දින සාර්ථකව අවසන් කරන ලද අතර, එමගින් අදාළ වාරි ව්‍යාපෘතීන්හි පරිමාව ඉහළ නැංවීමටත් වගාකළ හැකි කෘෂි බිම් ප්‍රමාණය වැඩිකරදීමටත් සමත්වී ඇත. මූලිකව මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා රුඃ 38,868,567.18 ක මුදලක් ඇස්තමේන්තුගත කළද, ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ කාර්යක්ෂම ශ්‍රම දායකත්වය මත රුඃ 19,812,659.85 ක වැය දැරීමක් මත එය සාර්ථකව අවසන් කිරීමට හැකි විය. තවද, මෙමගින් රුඃ 19,055,907.33 ක මුදලක් ඉතිරිකරදීමට ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව සමත්වී ඇත.

යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත නිමකළ මෙම ව්‍යාපෘති ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් ඒඑන් අමරසේකර යූඑස්පී එන්ඩීයූ, ඉංජිනේරු සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්සීඑස්බී විජේසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ සහ පොදු කාර්ය ඉංජිනේරු බලසේනාධිපති බ්‍රිගේඩියර් පීපීඒ පෙරේරා එච්ඩීඑම්සී පීඑස්සී ගේ මගපෙන්වීමෙන් ක්‍රියාත්මකය. එහිදී 5 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් ආර්එම්එල්කේ රත්නායක යූඑස්පී ශ්‍රීලංඉ සහ එම ඒකක හටපිරිස් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියටද 11 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් කේකේපී පුස්සේවෙල ආර්එස්පී ඇතුළු එම ඒකක හටපිරිස් වාරි පද්ධතීන් සකස් කිරීමේ ව්‍යාපෘතියටද දායක වූහ.

**ඉදිරිපත් කිරීම..**

***ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය, යුහමු.***





# කාල නිර්ණය...

**ගුරුතුමා** - ළමයි... "ඔවුන් කසාද බදින ලදී" කියන වාක්‍යය අනාගත කාලෙන් කියන්ඩ බලන්ඩ...

**පියල්** - "ඔවුන් දික්කසාද වන ලදී"



# මැෂිම...

**ටීචර්** - මම ඊයෙ ඔයාලට කිව්ව අද එද්දි මොකක් හරි තාක්ෂණික මෙවලමක් ගේන්න කියල... ඒක එක්කෙනා විස්තර කරන්න තමන් ගෙනා උපකරණය ගැන...

**සරත්** - ටීච... මං ගෙනාව කැල්කියුලේටර් එකක්... මේකෙන් ගණන් හදන්ඩ පුලුවන්... තාත්තගෙ මේසෙ උඩ තිබ්බෙ...

**කමලා** - ටීච... මම ගෙනාව ඔරලෝසුවක්... මේකෙන් අපි වෙලාව දැනගන්නවා... අම්ම තමයි දුන්නෙ...

**ටීචර්** - මොකක්ද අනුර පුතා මේ තරම් ලොකු උපකරණයක්...?

**අනුර** - මේක ටීච හොඳටම අමාරු ලෙඩ්ඩුන්ට හුස්ම ගන්ඩ යොදාගන්න මැෂිමක්... සීයගෙ කාමරේ තිබුණෙ...

**ටීචර්** - මේක ගොඩක් වටින එකක් වගෙයි... සීය එපා කිව්වෙ නැද්ද අරන් එද්දි...?

**අනුර** - අනේ නෑ ටීච... සීය ටික වෙලාවක් දඟල දඟලනම් හිටිය... ඊට පස්සෙ මොකුත් කීවෙනම් නෑ...





# ඉරට යාම...

මත් පැන් බී පදමට වෙරි වූ ඉන්දියානුවන් දෙදෙනකු කතා බහක යෙදෙමින් සිටියහ.

"ඇමෙරිකන් කාරයො ගියේ හඳට විතරයි නේද? ඒ නිසා අපි යන්න ඕන ඉරට" යි එකෙකු අනෙකාට කීය.

"ඒ වුනාට ඉර හරිම රස්නෙයිනෙ බං. ඕනෑවට වඩා ඉරට ළං වුනොත් අපිව රොකට් එකත් එක්කම පිච්චිලා අළු වෙලා යාවි" යි එකෙකු අනෙකාට කීය.

උඹ හරිම මෝඩයෙක්නෙ බං. ඒකට අපි කරන්න ඕනෙ රෑ වෙලා ඉරට ගොඩවෙන එකනෙ".

# යන්ඩ හදන තැන...

**මහල්ලා** - පුතේ... දැන් නුවර පැත්තෙන් කෝච්චියක් එයිද...?

**සිරිමල්** - අයියෝ සීයෙ... මේ දැන් කෝච්චියක් ගියා විතරයි...

**මහල්ලා** - එහෙනං ගාල්ලෙ පැත්තෙන් එකක් එයිද...?

**සිරිමල්** - ඒත් නෑ... ඇයි සීයට කොහාටද යන්ඩ ඕන...?

**මහල්ලා** - කොහෙවත් යන්ඩ නෙමෙයි... මට ඕනේ මේ රේල් පාරෙන් එහා පැත්තට පැන ගන්ඩ...



# අසමත් වීම...

ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වුවහොත් බයිසිකලයක් අරන් දෙන බවට තම පුතුට පොරොන්දුවක් ලබාදීමට පියා ඉදිරිපත් විය. නමුත් පසුව විභාග ප්‍රතිඵලවලින් තම පුතු අසමත්ව තිබිණ. ඒ ගැන පුතුගෙන් ප්‍රශ්ණ කළ පියාට ලැබුණේ මෙවන් පිළිතුරකි...

"මොනව කරන්නද තාත්තා... බයිසිකල් පදින්න ඉගෙන ගත්ත මිසක් පාසල් වැඩ ගැන බලන්ඩ බැරි වුණා."



# දිරිය පවුලකට සවියක් වෙමින්...





දාගම්පිටිය, කැළණිගම, ගිනිගත්හේන යන ලිපිනයේ පදිංචි දැඩි ආර්ථික දුෂ්කරතා මත ඉතා අසරණ තත්වයේ ජීවත්වන එන්කේජී මංගලා කුමාරි නුගලියද්ද මහත්මියට ඉකුත් ඔක්තෝබර් 10 වන දින නවීකරණය කරන ලද නිවසක් පරිත්‍යාග කෙරිණ. ප්‍රදේශයේ පරිත්‍යාගශීලීන්ගේ ධන පරිත්‍යාගයෙන් 19 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ ශ්‍රම දායකත්වයෙන් අළුත්වැඩියා කටයුතු සිදුකළ එම නිවස 112 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීජ්කේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සුරතින් අදාළ නිවාසලාභී කාන්තාව වෙත පිරිනමන ලදී.


රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම

සෙ/752158 බනි II සේනාරත්න ජීසී
3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ
එම්ජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලාන්ස් කෝප්‍රල්
ලක්තිළිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ
මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

යුහ දිගුව

51445/51446

ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලය







අධීක්ෂණය

බ්‍රිගේඩියර්
එච්එච්එල්පී අමරපාල
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී





උපදේශකත්වය

ලුතිනන් කර්නල් ඩීඑම්එම් දිසානායක
ආර්ඩබ්ලිව්පී





ප්‍රධාන සංස්කාරක

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ

# “මිත්‍ර ශක්ති” යුද අභ්‍යාසය සාර්ථකව අවසන් වෙයි...

ඉන්දීය යුද්ධ හමුදාව සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අතර පවත්නා සුහදත්වය හා සහයෝගය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් පැවැත්වූ 8 වන මිත්‍ර ශක්ති ඒකාබද්ධ යුද පුහුණු අභ්‍යාසයේ අවසන් ප්‍රහාරය පසුගිය ඔක්තෝබර් 15 වන දින මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ නගරබඳ සටන් පුහුණු පෙදෙසේ දී පැවැත්විණි. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ඉන්දීය යුද්ධ හමුදා ප්‍රධානී ජෙනරාල් මනෝජ් මුකුන්ද් නාරාවන (*General Manoj Mukund Naravane*) සහභාගී වූ අතර ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ද එම අවස්ථාවට එක්විය.

කර්නල් ප්‍රකාශ් කුමාර් ගේ අණදීම යටතේ ඉන්දීය යුද්ධ හමුදා භටයින් 120 දෙනෙකු සහ මේජර් මහේෂ් පතිරාජ ගේ අණදීම යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විජයබාහු පාබල රෙජිමේන්තුවේ භටයින් 120 දෙනෙකු සහභාගී වූ 8 වන මිත්‍ර ශක්ති ඒකාබද්ධ යුද පුහුණු අභ්‍යාසය 2021 ඔක්තෝබර් මස 03 වන දින ආරම්භ කෙරිණි. යුද්ධ හමුදාධිපති ගේ මගපෙන්වීම යටතේ 53 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී මෙම යුද අභ්‍යාසයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස බ්‍රිගේඩියර් පීඑන් ගොඩැල්ලවත්ත යූඑස්පී පීඑස්සී කටයුතු කළේය.

ඉන්දු - ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික ඒකාබද්ධ යුද අභ්‍යාසය අතරතුරදී, ජාත්‍යන්තර ත්‍රස්තවාදය, අන්තර් සම්බන්ධතා වැඩිදියුණු කරගැනීම, යුද සහයෝගීතාවය, ඒකාබද්ධ මෙහෙයුම් පැවැත්වීම, දෙරට අතර යුද අත්දැකීම් හුවමාරු කරගැනීම යනාදී කරුණු පිළිබඳ අවධානය යොමුකරමින් අම්පාර සටන් පුහුණු පාසලේදී උපාය මාර්ගික ක්‍රමවේදයන් උපයෝගි කරගනිමින් මෙම යුද අභ්‍යාසයේ පෙර පුහුණුවීම් සිදුකර නගරබඳ සටන් ඇතුළත් මෙම යුද අභ්‍යාසයේ අවසන් ප්‍රහාරය සාර්ථකව දියත් කරන ලදී.

සන්නාහ සන්නද්ධ රථ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් යානා යොදාගනිමින් සිදුකරනු ලැබූ පුහුණු අභ්‍යාසයන් සඳහා දෙරටේම යුද්ධ හමුදා භටපිරිස් සහභාගී වූහ. සති දෙකක් පුරාවට පැවති මෙවර යුද අභ්‍යාසයේ නිරීක්ෂකයින් ලෙස කටයුතු කළ කර්නල් ගිරිෂ් ගොඩියල් (*Colonel Girish Godial*), කර්නල් ජෝන් ඩැනියෙල් (*Colonel John Daniel*) සහ ලුතිනන් කර්නල් සුලාගේ මීරා (*Lieutenant Colonel Zulage Meera*) අභ්‍යාසයේ ප්‍රගතිය සහ ක්‍රියාකාරකම් ඇගයීමට ලක් කළහ.

සතුරන් සැඟව සිටින ස්ථාන වලට ප්‍රහාර එල්ල කිරීම් ඇතුළත් විනාඩි 40 ක පමණ කාලයක් පුරාවට පැවති මෙවර යුද අභ්‍යාසයේ අවසන් ප්‍රහාරය ඉන්දීය යුද්ධ හමුදා ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ගේ දැඩි අවධානය දිනාගැනීමට සමත්විය.













# දුරු රටකදී ගත් හුරු ඉලක්කය

රුසියානු එක්සත් සමුහාණ්ඩුවේ භූමි මෙහෙයුම් හමුදා ප්‍රධානී හා සේනාධිනායක ගේ ආරාධනයෙන් රුසියාවේ සංචාරයක නිරත ශ්‍රී ලංකාවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ඉකුත් ඔක්තෝබර් 26 වන දින රුසියානු හමුදාවේ ආරක්ෂක සන්නද්ධ රථ සේනාංකවලින් එකක් වන මොස්කව් නුවරට යාබදව පිහිටි නිරන්තර සූදානම (*constant readiness*) සේනාංකය ලෙස ප්‍රකට 4 වන ආරක්ෂක සන්නද්ධ රථ සේනාංකයේද (*4th Guards Tank Division*) සංචාරයක නිරත විය. එහිදී, එම සේනාංකය විසින් නිෂ්පාදනය කරන ලද ගිනි අවි කිහිපයක් පරීක්ෂා කර බැලීමටද ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිට අවස්ථාව හිමිවිය.